# 2026 ජුනි මාසයට අදාලව 2026.06.19 වන දින පවත්වන ලද බිබිල ප්‍රාදේශීය සභාවේ මහ සභා රැස්වීමේ වාර්තාව.

**දිනය** - 2026.06.19
**වේලාව** - පෙ.ව. 9.30
**ස්ථානය** - බිබිල ප්‍රාදේශීය සභාවේ සභා රැස්වීම් ශාලාව.

**සහභාගිත්වය -**

01. වී. සරත් විදානගම මැතිතුමා - ගරු සභාපති
02. එච්.එම්. අනුරසිරි ගුණසේකර මැතිතුමා - ගරු උප සභාපති
03. ආර්.බී. අත්තනායක මැතිතුමා - ගරු මන්ත්‍රී
04. ඩබ්.එම්. රූපසේන මැතිතුමා - ගරු මන්ත්‍රී
05. බී.එම්. වීරසේකර මැතිතුමා - ගරු මන්ත්‍රී
06. ආර්.බී. ප්‍රේමතිලක මැතිතුමා - ගරු මන්ත්‍රී
07. ඩී.එම්. ශ්‍රියානි මංගලිකා ජයලත් මැතිතුමිය - ගරු මන්ත්‍රී
08. ඩබ්.එම්.එම්. අසංක වාසළ මැතිතුමා - ගරු මන්ත්‍රී
09. පී. ජයන්ති මැතිතුමිය - ගරු මන්ත්‍රී
10. ඒ. එම්. ජානක නිමල් බණ්ඩාර මැතිතුමා - ගරු මන්ත්‍රී
11. ඒ. එම්. ධම්මික බණ්ඩාර මැතිතුමා - ගරු මන්ත්‍රී
12. පී.කේ.ඩී. රෝහිත පුෂ්ප කුමාර මැතිතුමා - ගරු මන්ත්‍රී
13. එම්.එම්. තිස්ස ගුණසිංහ මැතිතුමා - ගරු මන්ත්‍රී
14. කේ.ජී. උදය සඳරුවන් ජයසිංහ මැතිතුමා - ගරු මන්ත්‍රී
15. ඩබ්.එස්.එම්. වසන්ති ප්‍රියදර්ශනී සමරකෝන් මැතිතුමිය - ගරු මන්ත්‍රී
16. එල්.ඒ.බී. චින්තිකා හර්ෂනි මැතිතුමිය - ගරු මන්ත්‍රී
17. ඒ.ඩී. නිශාන්ත අමරතුංග මැතිතුමා - ගරු මන්ත්‍රී
18. ජේ.ඒ.ජී. විජේන්ද්‍රනාත් වර්ණකුලසූරිය මැතිතුමා - ගරු මන්ත්‍රී

## (අ). පසුගිය මාසයේ සභා රැස්වීමේ වාර්තාව සභා සම්මත කිරීම.

ගරු සභාපතිතුමා විසින් මූලාසනය හොබවන ලද අතර 2026.05.15 දින පවත්වන ලද මහ සභා රැස්වීම් වාර්තාව ගරු මන්ත්‍රී මණ්ඩලය වෙත 2026.06.12 වන දින යොමුකර ඇති බැවින් එම වාර්තා මෙම සභාවේ කියවූවා සේ සලකා වාර්තාව සභා සම්මත කර ගන්නා ලෙසත් වාර්තාවේ සංශෝධන කිසිවක් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙසත් මූලාසනය විසින් ගරු සභාවට දන්වන ලදි.

ගරු මන්ත්‍රී ඩබ් .එම්. රූපසේන මැතිතුමා විසින් 2026.05.15 දින පවත්වන ලද මහ සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීමේ යෝජනාව ඉදිරිපත් කරන ලදී.

එම යෝජනාව ගරු මන්ත්‍රී ආර්.බී.ප්‍රේමතිලක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඒ අනුව 2026.05.15 දින පවත්වන ලද මහ සභා රැස්වීම් වාර්තාව සභා සම්මත විය.

**<u>ගරු මන්ත්‍රී ඩබ්.එස්.එම්. වසන්තී ප්‍රියදර්ශනී සමරකෝන් මැතිතුමිය</u>**

2026.05.15 දින පැවති මහ සභාවේ ගරු මන්ත්‍රී ඩී.එම්.ශ්‍රියාණි මංගලිකා ජයලත් මැතිතුමිය විසින් "බිබිල ප්‍රදේශයේ මත්පැන් අලෙවිසැල් ද්‍රවිඩ ජාතිකයින්ගේ බව ගරු මන්ත්‍රී ඩබ්.එස්.එම්. වසන්ති ප්‍රියදර්ශනී සමරකෝන් මැතිතුමිය විසින් පැවසූ බවත් ඒවා ආරම්භ කරනු ලැබුවේ කවුරුන්දැයි

මන්ත්‍රීතුමිය විසින් ප්‍රශ්න කර ඇති බව ” සටහන් වන බවත් එම අවස්ථාවේ තමා සභා ගර්භයේ නොසිටි බැවින් එසේ තමා නොසිටි අවස්ථාවක ප්‍රශ්නයක් ඇසීම නුසුදුසු බවත් තමා එසේ ප්‍රකාශයක් නොකළ බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී එල්.ඒ.බී. චින්තිකා හර්ෂනි මැතිතුමිය පෙ.ව.9.40 ට සභා ගර්භයට පිවිසෙන ලදී.

ගරු මන්ත්‍රී ආර්.බී.අත්තනායක මැතිතුමා පෙ.ව.9.41 ට සභා ගර්භයට පිවිසෙන ලදී.

ගරු මන්ත්‍රී බී.එම්.වීරසේකර මැතිතුමා පෙ.ව.9.43 ට සභා ගර්භයට පිවිසෙන ලදී.

**(ආ).සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන.**

**(ආ).01. වාර්ෂික වෙළඳ බලපත්‍ර හා ව්‍යාපාර බදු සමීක්ෂණය - 2026**

බිබිල ප්‍රාදේශිය සභාවේ සේවයේ නියුතු ආදායම් පරීක්ෂක ආර්.එම්.සී.යූ.කේ.රත්නායක මහතා 2026.01.01. දින සිට 2026.06.01 දින දක්වා වාර්ෂික වෙළඳ බලපත්‍ර හා ව්‍යාපාර බදු සමීක්ෂණයක් සිදු කර තොරතුරු පහත පරිදි දක්වා ඇත.

| | |
|---|---|
| 01). 2026.01.01 දින සිට 2026.01.14 දින දක්වා | - රු. 199,800.00 |
| 02). 2026.01.15 දින සිට 2026.02.10 දින දක්වා | - රු. 165,680.00 |
| 03). 2026.02.11 දින සිට 2026.03.10 දින දක්වා | - රු. 314,800.00 |
| 04). 2026.03.11 දින සිට 2026.04.10 දින දක්වා | - රු. 370,880.00 |
| 05). 2026.04.11 දින සිට 2026.05.10 දින දක්වා | - රු. 282,840.00 |
| 06). 2026.05.11 දින සිට 2026.06.01 දින දක්වා | - රු. 201,700.00 |
| | රු. 1,535,700.00 |

අදාළ ගාස්තු අය කර ගැනීමට කටයුතු කරන බව හා ගරු සභාවට දැන ගැනීම සඳහා නිවේදනය කරන ලදී.

ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා පෙ.ව.9.47 ට සභා ගර්භයට පිවිසෙන ලදී.

**(ආ).02. වාර්ෂික දැන්වීම් පුවරු සමීක්ෂණය - 2026**

බිබිල ප්‍රාදේශිය සභාවේ සේවයේ නියුතු ආදායම් පරීක්ෂක ආර්.එම්.සී.යූ.කේ.රත්නායක මහතා 2026.01.01 දින සිට 2026.06.01 දින දක්වා වාර්ෂික දැන්වීම් පුවරු සමීක්ෂණයක් සිදු කර තොරතුරු පහත පරිදි දක්වා ඇත.

| | |
|---|---|
| 01). 2026.01.01 දින සිට 2026.01.14 දින දක්වා | - රු. 223,950.00 |
| 02). 2026.01.15 දින සිට 2026.02.10 දින දක්වා | - රු. 235,400.00 |
| 03). 2026.02.11 දින සිට 2026.03.10 දින දක්වා | - රු. 383,500.00 |
| 04). 2026.03.11 දින සිට 2026.04.10 දින දක්වා | - රු. 315,000.00 |
| 05). 2026.04.11 දින සිට 2026.05.10 දින දක්වා | - රු. 217,550.00 |
| 06). 2026.05.11 දින සිට 2026.06.01 දින දක්වා | - රු. 180,000.00 |
| | රු.1,555,400.00 |

අදාළ ගාස්තු අය කර ගැනීමට කටයුතු කරන බව හා ගරු සභාවට දැන ගැනීම සඳහා නිවේදනය කරන ලදී.

ගරු මන්ත්‍රී පී.කේ.ඩී.රෝහිත පුෂ්ප කුමාර මැතිතුමා පෙ.ව.9.50 ට සභා ගර්භයට පිවිසෙන ලදී.

## (ආ).03.ඝන අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහන -2026

බිබිල ප්‍රාදේශීය සභාව මගින් පුවක්පැලේ ක්‍රියාත්මක කරනු ලබන කොම්පෝස්ට් ව්‍යාපෘතියේ ප්‍රගතිය

සහ ගැටළු පිළිබඳ බිබිල ප්‍රදේශයේ රාජ්‍ය නිළධාරීන් සහ මධ්‍යම පරිසර අධිකාරි නිළධාරීන් සමග සාකච්ඡාවක් 2026.05.07 දින බිබිල ප්‍රාදේශීය සභා ශ්‍රවණාගාරයේ දී පවත්වන ලදී. එම සාකච්ඡාවට අදාලව සහ මෙතෙක් ක්‍රියාත්මක කළ වැඩසටහන් වලට සමගාමීව බිබිල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ආයතන, පාසල් , නිවාස හා බිබිල නගරය ඉලක්ක කර ගනිමින් බිබිල සෞඛ්‍ය වෛද්‍ය නිළධාරි කාර්යාලයෙන් එවන ලද විධිමත් ඝන අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහන ගරු සභාවට දැන ගැනීම සඳහා නිවේදනය කරන ලදී. (අමුණා ඇත)

**ගරු මන්ත්‍රී එම්.එම්.තිස්ස ගුණසිංහ මැතිතුමා**

ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහන - 2026 නමින් තමා වෙත ලැබී ඇති වැඩසටහන් මාලාවෙහි දක්වා ඇති අපද්‍රව්‍ය එකතු කරනු ලබන ස්ථානයන් වලට දැනට අපද්‍රව්‍ය එකතු කරනු ලබන බදුල්ල හා මහියංගන පාර ඇතුළත්ව නොමැති බවත් එමගින් පෙනී යන්නේ දැනට කසළ එකතු කිරීම ක්‍රියාත්මක කරනු ලබන ස්ථානයන් පවා ඇතුළත් නොවන බවයි. ඒ පිළිබඳව ගරු මූලාසනය විසින් අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටින ලදී.

**ගරු මන්ත්‍රී එල්.ඒ.බී.චින්තිකා හර්ශනී මැතිතුමිය**

බිබිල බස්නැවතුම්පොළ කසළ එකතු කිරීම පෙ.ව.7.00 – 7.45 දක්වා ලෙස මෙහි සඳහන් වුවද මේ වෙලාවේ පාසල් ළමුන් වැඩිපුර ගැවසෙන බැවින් උදැසන 6.00 – 6.45 අතර කාලය මේ සඳහා යොදා ගන්නේ නම් සුදුසු බව පැවසීය.

**ගරු සභාපති වී.සරත් විදානගම මැතිතුමා**

බිබිල බස් නැවතුම්පොළ කඩ කාමර හිමියන් විසින් කසළ ඉවත් කරනු ලබන්නේ පෙ.ව. 7.00 න් පමණ පසු බැවින් උදැසන 6.00 ට කසළ එකතු කළහොත් එම කසළ එකතු කිරීමට අවස්ථාවක් නොලැබෙන බැවින් උදැසන 7.00 – 7.45 දක්වා කාලය යොදා ගෙන ඇති බවයි.

බදුල්ල හා මහියංගන මාර්ගයේ කසළ එකතු කිරීම මේ වන විටත් බිබිල ප්‍රාදේශීය සභාව මඟින් සිදු කරන බව පැවසීය. මෙම ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ වැඩසටහන් වාර්තාව බිබිල සෞඛ්‍ය වෛද්‍ය නිළධාරි කාර්යාලය මඟින් ප්‍රාදේශීය සභාව වෙත එවා ඇති බවත් මෙම වැඩසටහන පිළිබඳව බිබිල සෞඛ්‍ය වෛද්‍ය නිළධාරි කාර්යාලයේ ප්‍රධාන මහජන සෞඛ්‍ය පරීක්ෂක සහා රැස්වීමෙන් අනතුරුව සාකච්ඡා කිරීමට බලාපොරොත්තුවෙන් සිටින බව පැවසීය.

## (ආ).04. කසළ කළමණාකරනය පිළිබඳව මන්ත්‍රී මණ්ඩලය දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීම.

බිබිල සෞඛ්‍ය වෛද්‍ය නිළධාරි කාර්යාලයේ ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිළධාරි විසින් 2026.06.19 දින මහ සභා රැස්වීමෙන් අනතුරුව විනාඩි 45ක පමණ කාලයක් තුළ කසළ කළමණාකරණය පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහනක් බිබිල ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රී මණ්ඩලය වෙනුවෙන් පවත්වන බැවින් ඒ සඳහා මන්ත්‍රී මණ්ඩලයේ සියළු දෙනා සහභාගි වන ලෙස දන්වා සිටිමි.

ගරු මන්ත්‍රී කේ.ජී.උදය සඳරුවන් ජයසිංහ මැතිතුමා පෙ.ව.10.50 ට සභා ගර්භයට පිවිසෙන ලදී.

## (ඇ).ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි, හා සන්නිවේදන සභාව ඉදිරියේ තැබීම.

කිසිවක් ඉදිරිපත් වී නොමැත.

## (ඈ).යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න.

කිසිවක් ඉදිරිපත් වී නොමැත

## (ඉ).යථාපරිදි කල්දී ඇති යෝජනා.

## (ඉ).01.ගරු මූලාසනයේ යෝජනා.

### (ඉ).01.01. බිබිල ප්‍රාදේශීය සභාව සතු පොදු වෙළඳපොල ගොඩනැගිල්ලේ කඩ කාමරවල මාසික කුලිය තක්සේරු කිරීම.

බිබිල ප්‍රාදේශීය සභාව සතු පොදු වෙළඳපොළ ගොඩනැගිල්ලේ කඩ කාමර සඳහා අයකළ යුතු මාසික කුලී මුදල සඳහා නව තක්සේරු වාර්තාව ලැබී ඇත. පහත සඳහන් එම තක්සේරු වාර්තාවට අනුව නව කුලී මුදල 2026 අගෝස්තු මස සිට අය කිරීමට සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

| අනු අංකය | කඩ කාමර අංකය | මාසික කුලී මුදල රු. |
|---|---|---|
| 01 | A01 | 30,000.00 |
| 02 | A02 | 30,000.00 |
| 03 | A03 | 30,000.00 |
| 04 | A04 | 30,000.00 |
| 05 | A05 | 28,000.00 |
| 06 | A06 | 28,000.00 |
| 07 | A07 | 28,000.00 |
| 08 | A08 | 28,000.00 |
| 09 | A09 | 28,000.00 |
| 10 | A10 | 28,000.00 |
| 11 | A11 | 28,000.00 |
| 12 | A12 | 28,000.00 |
| 13 | A13 | 28,000.00 |
| 14 | A14 | 28,000.00 |
| 15 | A15 | 28,000.00 |
| 16 | A16 | 28,000.00 |
| 17 | B01 | 7,000.00 |
| 18 | B02 | 7,000.00 |

| | | |
|---|---|---|
| 19 | B03 | 7,000.00 |
| 20 | B04 | 7,000.00 |
| 21 | B05 | 8,000.00 |
| 22 | B06 | 7,500.00 |
| 23 | B07 | 7,500.00 |
| 24 | B08 | 7,500.00 |
| 25 | B09 | 7,500.00 |
| 26 | B10 | 7,500.00 |
| 27 | B11 | 7,500.00 |
| 28 | B12 | 7,500.00 |
| 29 | B13 | 7,500.00 |
| 30 | B14 | 7,500.00 |
| 31 | B15 | 7,500.00 |
| 32 | B16 | 7,500.00 |
| 33 | B17 | 7,500.00 |
| 34 | B18 | 7,500.00 |
| 35 | B19 | 7,500.00 |
| 36 | B20 | 5,500.00 |
| 37 | B21 | 5,500.00 |
| 38 | B22 | 5,500.00 |
| 39 | B23 | 5,500.00 |
| 40 | B24 | 5,500.00 |
| 41 | B25 | 5,500.00 |
| 42 | B26 | 5,500.00 |
| 43 | B27 | 5,500.00 |
| 44 | B28 | 8,900.00 |
| 45 | B29 | 5,500.00 |
| 46 | B30 | 5,500.00 |
| 47 | B31 | 5,500.00 |

| | | |
|---|---|---|
| 48 | B32 | 5,500.00 |
| 49 | B33 | 7000.00 |
| 50 | B34 | 8,600.00 |
| 51 | B35 | 5,500.00 |
| 52 | B36 | 5,500.00 |
| 53 | B37 | 5,500.00 |
| 54 | B38 | 5,500.00 |
| 55 | B39 | 5,500.00 |
| 56 | B40 | 5,500.00 |
| 57 | B41 | 10,000.00 |
| 58 | C01 | 5,000.00 |
| 59 | C02 | 5,000.00 |
| 60 | C03 | 5,000.00 |
| 61 | C04 | 5,000.00 |
| 62 | C05 | 5,000.00 |
| 63 | C06 | 5,000.00 |
| 64 | C07 | 5,000.00 |
| 65 | C08 | 5,000.00 |
| 66 | C09 | 5,000.00 |
| 67 | C10 | 5,000.00 |
| 68 | C11 | 4,800.00 |
| 69 | C12 | 6,500.00 |
| 70 | C13 | 6,500.00 |
| 71 | C14 | 4,000.00 |
| 72 | C15 | 4,000.00 |

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

**ගරු මන්ත්‍රී එම්.එම්.තිස්ස ගුණසිංහ මැතිතුමා**

බිබිල පොදු වෙළඳපොළ ගොඩනැගිල්ලේ කඩ කාමරවල මාසික කුලී මුදල් නව තක්සේරුව මෙන්ම මෙතෙක් අයකළ ගාස්තුව ඉදිරිපත් කරන්නේ නම් නව තක්සේරුවෙන් වැඩිවන මුදල පිළිබඳව සන්සන්ධනාත්මකව අවබෝධ කර ගත හැකි බව පැවසීය.

අදාළ කරුණ සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට මහ සභාව කාරක සභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු උප සභාපති එච්.එම්. අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඒ.එම්.ධම්මික බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

සාකච්ඡාවෙන් අනතුරුව කාරක සභාව නැවත මහ සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු උප සභාපති එච්.එම්. අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඒ.එම්.ධම්මික බණ්ඩාර මැතිතුමා ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් විවාද අවස්ථාව අවසන් බව මූලාසනය විසින් ගරු සභාවට දැනුම් දෙන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අසුන්ගෙන සිටි මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවූයෙන් ඒකමතිකව සභා සම්මත විය.

**(ඉ).01.02. මත්පැන් බලපත්‍රයක් ලබා ගැනිම සම්බන්ධවයි.**

උක්ත කරුණ සම්බන්ධව ලංකා සතොස, බිබිල කළමනාකරු වන එම්.ජී.ඩී.ජී. අබය ගුණවර්ධන මහතා විසින් 2025.05.26 දිනැතිව ඉදිරිපත් කර ඇති ඉල්ලීම් ලිපිය මඟින් බිබිල සතොස අලෙවිසැලේ මත්පැන් අලෙවිසැලක් ආරම්භ කිරිමට සැලසුම් සකස් කරමින් සිටින බවත්, බිබිල සතොස අලෙවිසැලට මත්පැන් අලෙවි කිරිමට අවස්ථාවක් ලබා ගැනිම සඳහා මත්පැන් බලපත්‍රයක් ලබා ගැනිමට අවශ්‍ය සහය ලබා දී ඒ සඳහා අනුමැතිය ලබා ගැනිමට අවශ්‍ය කටයුතු සිදු කර දෙන ලෙස ඉල්ලීම් කර ඇත.

ඒ අනුව 2026.04.21 හා 2026.05.15 දින මහ සභාවන් වලදී සාකච්ඡා කළද තීරණයක් ගැනීම සඳහා ඉදිරි මහ සභාවට කල්තබා ඇත. එබැවින් සතොස කළමනාකරු විසින් ඉදිරිපත් කර ඇති ඉල්ලීම සම්බන්ධව තීරණයක් ගැනිමට මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එම්.එම්.අසංක වාසළ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

**ගරු මන්ත්‍රී එම්.එම්.තිස්ස ගුණසිංහ මැතිතුමා**

බිබිල සතොස ආයතනය සඳහා මත්පැන් බලපත්‍රය ලබා දෙනු ලබන්නේ සුරා බදු දෙපාර්තමේන්තුවෙන් බවත් සතොස ආයතනය බිබිල ප්‍රාදේශීය සභාවෙන් ඉල්ලුම් කරනු ලබන්නේ එම ගොඩනැගිල්ලෙහි මත්පැන් ව්‍යාපාරය ආරම්භ කිරීමට ඉඩකඩක් වෙන්කර දීමට අකමැත්තක් නොමැතිද යන්නයි. සභා වාර දෙකකදීම මෙම යෝජනාව සාකච්ඡාවට භාජනය වූ බවත් සැමදා පවසන ආකාරයෙන් සමගි ජනබලවේගය, බිබිල ප්‍රදේශයේ ජනතාවට ප්‍රදේශයේ සංවර්ධනයට බලපාන යෝජනාවන් වන්නේ නම් ඒ සඳහා පාට පක්ෂ භේදයකින් තොරව සහයෝගය ලබා දෙන බවයි. සමගි ජනබලවේගය මෙරට වෙළඳපොළ ආර්ථිකය හා විවෘත ආර්ථිකය හඳුන්වා දීමට කටයුතු කළ පක්ෂයක් බැවින් දේශපාලන ප්‍රතිපත්ති වශයෙන් ද ගැටලුවක් නොමැති බවයි.

පසුගිය සභාවාරයේ මෙම යෝජනාව පිළිබඳ සාකච්ඡා කරනවිටසභා ගර්භයේ නොසිටියත් ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයෙකු මෙම යෝජනාවට විරුද්ධව අකමැත්ත ප්‍රකාශ ඇත් බවත් සභාව මගින් ක්‍රියාත්මක කිරීමට නුසුදුසු යෝජනා සඳහා විරෝධතාවය ප්‍රකාශ කර ඇති බව වාර්තාව මගින් අවබෝධ කරගත් බව පැවසීය. මොණරාගල දිස්ත්‍රික්කයේ බුත්තල, වැල්ලවාය, අවිස්සාවේල්ල යන සතොස අලෙවිසැල්හි මත්පැන් අලෙවිසැල් පවත්වාගෙන යන බවත් ලංකාව පුරාම සතොස අලෙවිසැල්වල පවත්වාගෙන යන බවත් ලංකාව පුරාම සතොස අලෙවිසැල්වල මත්පැන් අලෙවිසැල් 20ක් පමණ ආරම්භ කර තිබෙන බැවින් බැවින් බිබිල සතොස අලෙවිසැලෙහිද මෙය ආරම්භ කිරීමට සුදුසු බවත් එබැවින් සමගි ජනබලවේගයේ මන්ත්‍රීවරුන් හතර දෙනාම මෙම යෝජනාව සඳහා එකඟතාවය පල කරන බව පැවසීය.

<u>ගරු මන්ත්‍රී ඩබ්.එස්.එම්.වසන්ති ප්‍රියදර්ශනී සමරකෝන් මැතිතුමිය</u>

පසුගිය සභාවාරයේ තමන් මෙම යෝජනාව සාකච්ඡා කරන අවස්ථාවේ සභා ගර්භයේ නොසිටි අතර සහෝදර මන්ත්‍රීවරියක් විසින් බිබිල ප්‍රදේශයේ මත්පැන් අලෙවිසැල්වල හිමිකරුවන් දෙමළ ජාතීන් බව තමන් විසින් පැවසූ බවත් හා ඒවා කවුරුන් විසින් ආරම්භ කළේ දැයි විමසා ඇති බවත් වාර්තාවේ සටහන්ව ඇති බවත් තමන් එම අවස්ථාවේ සභාවේ නොසිටි නිසා මෙම අවස්ථාවේ එම පැනයට පිළිතුරක් ලෙස සුරාබදු කොමසාරිස් දෙපාර්තමේන්තුව විසින් ආරම්භ කර ඇති බව ප්‍රකාශ කරන බව පැවසීය. එතුමියගේ කතාවේදී බිබිල නගරයේ සුරාසැල් ආරම්භ කර ඇත්තේ නීතිරීති උල්ලංඝනය කර බව දක්වා ඇතත් ගරු සභාපතිතුමාගේ කතාවේදී වුවද සුරාබදු නීතිරීති වලට අනුකූලව සුරාසැල් ආරම්භ කරන්නේ නම් තම ආණ්ඩුවටද ඒවා ආරම්භ කිරීමට විරුද්ධ විය නොහැකි බව ප්‍රකාශ කර ඇත. එකළ පැවති ආණ්ඩුවලට වුවද සුරාබදු නීතිරීතිවලට අනුකූලව මත්පැන් අලෙවිසැල් ආරම්භ කිරීමට අනුමැතිය, බලපත්‍ර ඉල්ලූවිට විරුද්ධවීමට නොහැකි වන්නට ඇතැයි පැවසීය. බිබිලේ මත්පැන් අලෙවිසැල් ආරම්භ කර ඇත්තේ අනුකූලව නොවේ නම් ඒ පිළබඳව සුරාබදු කොමසාරිස් තුමාගෙන් විමසීමක් කර අනුකූලතාවය තහවුරු කර ගත හැකිබව පැවසීය.

ගරු මන්ත්‍රීවරිය විසින් සභාවට ගෙන එනු ලබන සියළු යෝජනා සඳහා එහෙයියන් නොවන බවත් දක්වා ඇති බැවින් විපක්ෂයේ මන්ත්‍රී මණ්ඩලයේ සියළු දෙනා දිළිසෙන සියල්ල රත්තරන් නොවේ යැයි හඳුනාගත නොහැකි කණ්ඩායමක් නොවේ යැයි පැවසීය. මත්පැන් අලෙවිසැල් එකිනෙක වසා දැමීමට කටයුතු කරමු යැයි මන්ත්‍රීවරිය දක්වා තිබුණද ගරු රනිල් වික්‍රමසිංහ ජනාධිපතිවරයාගේ සමයෙහි ආරම්භ කළ මත්පැන් අලෙවිසැල් සුරාබදු නීතිරීතිවලට අනුකූලව ආරම්භ කර ඇති බව පවතින ආණ්ඩුවද පිළිගෙන ඇති බව පැවසීය. ගරු ජනාධිපති අනුරකුමාර දිසානායක මැතිතුමා වුවද රටේ දෙවන ආදායම සුරාබදු ආදායම බව පිළිගෙන ඇති මොහොතක අණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරියක් සුරාසැල් වැසීමට කටයුතු කිරීමට කටයුතු කරන්නේ ප්‍රකාශ කරන්නේ මන්දැයි විමසීය.

කසිප්පු , ගංජා , ගෝඩා ,හෙරොයින්, අයිස් වැනි නීත්‍යානුකූල නොවන මත්ද්‍රව්‍ය බිබිල ප්‍රදේශයේ පසුගිය වර්ෂය තුළ කසිප්පු නඩු 106ක් පමණ, ගංජා නඩු 113492ක් පමණ ගෝඩා නඩු 53ක් පමණ හෙරොයින් නඩු 470ක් පමණ හඳුනා ගෙන ඇති බව පැවසූ අතර නීත්‍යානුකූල නොවන මත්ද්‍රව්‍ය භාවිතය වැඩිවී ඇත්තේ නීත්‍යානුකූල මත්පැන් අලෙවිසැල් නොමැති නිසා වන්නට ඇතැයි පැවසීය. මෙවැනි නීත්‍යානුකූල නොවන මත්පැන් ඇබ්බැහිය වළක්වා ගැනීමට නීත්‍යානුකූල ප්‍රමිතිගත මත්ද්‍රව්‍ය අලෙවිසැලක් බිබිල සතොසෙහි ආරම්භ කිරීම සුදුසු බවයි. එබැවින් සමගි ජනබල වේගයේ මන්ත්‍රී මණ්ඩලය රටට දෙවන ආදායම ගෙන එන සුරාබදු ආදායම නගා සිටුවීම බිබිල සතොස අලෙවිසැලෙහි මත්පැන් අලෙවිසැලක් ආරම්භ කිරීමට එකගතාවය ලබා දීමට කැමති බව ප්‍රකාශ කරන ලදී. බිබිල ප්‍රදේශයේ නීතිවිරෝධී මත්ද්‍රව්‍ය අලෙවි කරන්නන් නීතියේ රැහැනට හසු කරගෙන නීතිය ක්‍රියාත්මක කිරීම පිළිබඳව බිබිල පොලීසියේ වත්මන් ස්ථානාධිපති වරයාට හා එම කාර්ය මණ්ඩලයට ස්තුතිය පුද කරන ලදී.

__ගරු මන්ත්‍රී පී.කේ.ඩී.රෝහිත පුෂ්ප කුමාර මැතිතුමා__

රටෙහි වැඩිම මත්පැන් අලෙවිසැල් ආරම්භ කරන ලද පක්ෂයක නියෝජිතයෙකු වන තමන් පක්ෂයේ ප්‍රතිපත්තියට මෙය අනුකූල වුවද පෞද්ගලිකව බිබිල සතොසෙහි මත්පැන් අලෙවිසැලක් ආරම්භ කිරීමට විරුද්ධ බව පැවසීය. සුරාබදු ආදායම රජයේ දෙවන ආදායම් මාර්ගය වුවද මහරගම පිළිකාරෝහල, රාගම ළය රෝහල සඳහා මෙන්ම මෙම මත්පැන් භාවිතය නිසා විවිධ රෝගාබාධවලට ගොදුරුව සිටින ජනතාව වෙනුවෙන් වැයවන මුදල අනුව බලන විට රජයේ ආදායමට වඩා රජයේ වියදම වැඩි වන බව පැවසීය.

සතොස ආයතනය රාජ්‍ය ආයතනයක් බැවින් මේ සඳහා ප්‍රාදේශීය සභාවේ එකඟතාවය ලබාදුනහොත් බිබිලේ පෞද්ගලික වාණිජ ආයතනද මත්පැන් අලෙවිසැල් ආරම්භ කිරීමට අවසර ඉල්ලුවහොත් අවසර ලබාදීමට සිදුවන බව පැවසූ අතර බිබිලේ ආරම්භ කර ඇති මත්පැන් හල් සියල්ලම නීතිරීති උල්ලංඝණය කරමින් ආරම්භ කර ඇති බව පැවසූ අතර සියලුම මත්පැන්හල් පන්සල් පාසල් වලට 500m ක් දුරින් පිහිටා නොමැති බව පෙන්වා දුන් අතර මේවා ආරම්භ කිරීමට අතයට ගනු දෙනුවක් සිදුවුණා දැයි සැකයක් පවතින බවද වැඩිදුරටත් පැවසීය.

ආරම්භ කිරීමට බලාපොරොත්තු වන සතොස මත්පැන් අලෙවිසැල ළමා උද්‍යානය , ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, මහජන ක්‍රීඩාංගනය වැනි ස්ථානයන්ට ආසන්නයේම පිහිටා ඇති අතර මෙම ස්ථානයේ ආරම්භ කළහොත් ළමා උද්‍යානයට , ක්‍රීඩා පිට්ටනියට දරුවා රැගෙන එන පියා මෙම ස්ථානයෙන් මත්පැන් පානය කිරීමට පුරුදු වන බවත් ඉදිරියේ ඇති රාජ්‍ය ආයතනයේ සේවය කරන රාජ්‍ය නිළධාරීන් තම වැටුප ලබා ගෙන නිවසට රැගෙන යන බඩු වලින් කොටසක් හෝ අඩු කර මත්පැන් මිලදී ගැනීමට මෙන්ම මහජන ක්‍රීඩා පිටියේ ක්‍රීඩා කරන පුද්ගලයින් ක්‍රීඩා කර අවසන්ව යනවිට මත්පැන් මිලදී ගැනීමට පෙළඹෙන බවත් අනාගතයේදී මේවා දැක ගැනීමට හැකිවන බවත් එවන් පසුබිමක් ඇති කිරීමටද ? අප එකගතාවය දක්වන්නේ යැයි අසන ලදී.

ගරු මන්ත්‍රී ඩබ්.එස්.එම්.වසන්ති ප්‍රියදර්ශනී සමරකෝන් මැතිතුමිය විසින් නීත්‍යානුකූල නොවන මත්ද්‍රව්‍ය අලෙවි කරන්නන් නීතියේ රැහැනට හසුකර ගැනීම පිළිබඳව පොලිස් ස්ථානාධිපති හා එම කාර්ය මණ්ඩලයට ස්තූතිය පුද කළද එසේ ස්තූති කළ යුතු නොවන බවත් එය ඒ අයගේ රාජකාරිය බව පැවසීය. වසමක් තුළ රාජ්‍ය නිළධාරීන් 6ක් සේවය කරන බැවින් මෙම නීතිවිරෝධී මත්පැන් පිළිබඳව අවධානය යොමුකළ හැකි බවත් ඒ අය මේ සම්බන්ධයෙන් දැනගෙන රාජකාරි නොකර සිටින බව පැවසීය.

දෙවන රාජ්‍ය ආදායම බවට සුරාබදු ආදායම පත්ව ඇත්තේ මෙම මත්පැන් සඳහා දරාගත නොහැකි බදු පැනවීම මගින් බව පැවසීය. විශාල බදු බරක් පටවා නීත්‍යානුකූල මත්පැන්වල මිල ඉහළ යෑම නිසා දිනක් කුලී වැඩ කර උපයා ගන්නා රු.3000.00 ක මුදලින් නීත්‍යානුකූල මත්පැන් මිලදී ගතහොත් නිවසට රැගෙන යාමට අවශ්‍ය ද්‍රව්‍ය රැගෙන යෑමට නොහැකි වන බැවින් නීත්‍යානුකූල නොවන අඩු මිලක් ගෙවා මිලදී ගතහැකි මත් ද්‍රව්‍යයක් භාවිතා කිරීමට පුරුදුව ඇති බවයි. සතොස අලෙවි සැලෙහි මත්පැන් අලෙවිසැලක් ආරම්භ කිරීමෙහි නරක ආදීනව මෙලෙස දක්වන අතර මෙහි ඇති හොඳ පැත්ත ලෙස ඉතා ඉහළ ප්‍රමිතිගත මත්පැන් රාජ්‍ය ආයතනවල අලෙවි කරනවා යැයි ජනතාව තුළ ඇති හැඟීම මත එම සතොස අලෙවිසැලේ මත්පැන් මිලදී ගැනීමට ජනතාව පෙළඹීම මෙන්ම විදේශීය සංචාරකයින් පවා මෙම සතොස අලෙවිසැලට පැමිණෙන බවත් පැවසූ අතර රජයේ ආදායම ඉහළ යන බවත් පැවසීය.

__ගරු මන්ත්‍රී ජේ.ඒ.ජී.විජේන්ද්‍රනාත් වර්ණකුලසූරිය මැතිතුමා__

පසුගිය සභා වාරයේදී සතොස අලෙවි සැලේ මත්පැන් ව්‍යාපාරයක් ආරම්භ කිරීමට විරුද්ධව ගරු මන්ත්‍රී ඩී.එම්.ශ්‍රියාණි මංගලිකා ජයලත් මැතිතුමිය හඬක් නැගුවේ ආණ්ඩුවේ හඬ යටපත් කිරීමටද එසේත් නැතිනම් පෞද්ගලික හේතුවක් මත දැයි තමා නොදන්නා බව පැවසූ අතර තමා දකුණු කොරියාවේ විදෙස්ගතව සිටි සමයෙහි එම රටෙහි සියළුම වෙළඳසැල්හි මත්පැන් අලෙවිය සිදුවූ බව පැවසූ අතර

එබැවින් ලංකාවේද මෙවැනි ව්‍යාපාර ආරම්භ කිරීමට පුද්ගලිකව එකඟතාවය ප්‍රකාශ කරන බව පැවසීය. එයට හේතුව සාමාන්‍ය වෙළඳසැලක මෙන් නොව පෞද්ගලික මත්පැන් වෙළඳසැල්වල පාරිභෝගිකයාට කිසිදු ගරු කිරීමක් හෝ සුහදශීලීබවක් නොපවත්වන ස්ථානයක් බවත් එයට හේතුව කරගකාරිත්වය බවත්ය. එබැවින් එම තත්වය නැති කිරීමට නම් මත්පැන් අලෙවි සැල් විශාල ප්‍රමාණයක් ආරම්භ වියයුතු බවත් එසේ ආරම්භ කරන්නේ නම් එම සියළු මත්පැන් අලෙවිසැල් ආරම්භ කිරීමට තමා එකඟ වන බව පැවසීය.

එවිට මත්පැන් අලෙවිසැල්වල ගුණගරුකබව , සුහදශීලීබව ඇතිවනු ඇතැයි පැවසීය. නීත්‍යානුකූල නොවන මත්ද්‍රව්‍ය භාවිතයට ජනතාව පුරුදුවී ඇත්තේ නීත්‍යානුකූල මත්පැන්වල මිල අධිකවීම බව පැවසූ අතර තරගකාරිත්වය වර්ධනය වූයේ නම් ඒවායේ මිලද අඩුවනු ඇතැයි පැවසීය. තමන්ද සතොස අලෙවිසැලෙහි මත්පැන් අලෙවිසැලක් ආරම්භ කිරීමට එකඟතාවය ලබා දෙන බව පැවසීය. නීත්‍යානුකූලභාවය පිළිබඳව නම් අවබෝධයක් නොමැති වුවත් අඩු මිලට අලෙවි කළහැකි පොල් රා අලෙවි කිරීමටද සුරාසැල් ආරම්භ කිරීමට හැකි නම් සුදුසු බවත් එවිට රු.4500.00ක් වැනි විශාල මුදලක් වැයකර මත්පැන් බොතලයක් මිලදී ගැනීමට නොහැකි ජනතාවට රු.300.00ක් වැන් මුදලක් දී රා බෝතලයක් මිලදී ගෙන පානය කර සතුටු වන බව පැවසූ අතර මෙම ස්ථානයේ මත්පැන් අලෙවිසැල් ආරම්භ කර බිබිල ප්‍රාදේශීය සභාවට ද අය කරගනු ලබන මුදල වැඩිකර ගැනීමට හැකි වේ නම් සුදුසු බවත් ඒ පිළිබඳ ගරු මූලාසයේ අවධානය යොමු කරන ලෙසද ඉල්ලා සිටින ලදී.

<u>ගරු මන්ත්‍රී ඒ.එම්.ධම්මික බණ්ඩාර මැතිතුමා</u>

තමා මෙම යෝජනාවට විරුද්ධතාවය හෝ එකඟතාවය පල කිරීමට නොව මධ්‍යස්ථ අදහසක් දක්වන බව පැවසීය. මිනිසාගේ ශරීරයට කිසියම් ප්‍රමාණයක් අවශ්‍ය බවත් ජනතාව විසින් එම ශරීරයට අවශ්‍ය ඇල්කොහොල් ප්‍රමාණයට නොව අවභාවිත කරන බවත් අත්දැකීම් නොමැති බවත් ජනතාව පවසන ආකාරයට නීත්‍යානුකූල නොවන පෞද්ගලික මත්පැන් අලෙවිසැල්වල අලෙවි කරන බව හා එසේම සතොස ,කාගිල්ස් ,කීල්ස් වැනි ආයතනනවල මත්පැන් නීත්‍යානුකූල මත්පැන් බවත් අසා ඇති බව පැවසීය. ගරු මන්ත්‍රී ඩබ්.එස්.එම්. වසන්ති ප්‍රියදර්ශනී සමරකෝන් මැතිතුමිය විසින් බිබිල පොලිස් ස්ථානාධිපති ඇතුළු කාර්ය මණ්ඩලයට ස්තූති කළ බවත් එයට තමන්ද එකඟවන බවත් මෙතෙක් කාලයක් නීත්‍යානුකූල නොවන මත්පැන් අලෙවිය දේශපාලන සහයෝගය ඇතිව සිදුකර ඇති බවත් වර්තමානයේ එසේ නොවන බවත් නීතිය ක්‍රියාත්මක කරන බවත් පැවසූ අතර මෙම ආණ්ඩුව නීත්‍යානුකූල නොවන මත්පැන් අලෙවියට සම්බන්ධ නොවන බවත් නීතිය නිසියාකාරව ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන බවත් මෙමගින් පැහැදිලි වන බව පැවසීය.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් විවාද අවස්ථාව අවසන් බව මූලාසනය විසින් ගරු සභාවට දැනුම් දෙන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අසුන්ගෙන සිටි මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවූයෙන් ඒකමතිකව සභා සම්මත විය.

**<u>(ඉ).01.03.ඝණ අපද්‍රව්‍ය සඳහා කසළ බදු අය කිරීම සම්බන්ධවයි.</u>**

පළාත් පාලන දෙපාර්තමේන්තුව හා රාජ්‍ය විගණන ආයතනය යන ආයතන විසින් කසල බදු අය නොකිරීම සම්බන්ධයෙන් විමසීම් කර ඇත. මෙම කසළ බදු අය කිරීමට වීදි කසළ හා නිවාස කසළ හැර සභාව මගින් කසළ ලබා ගන්නා රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතන, වෙළඳසැල්, ආපන ශාලා, හෝටල්, කඩ යන ආයතන වලින් කසළ බදු අයකළ යුතු බව අතුරු ව්‍යවස්ථා මගින් පනවා ඇත.

කසළ බදු අයකිරීමේ ක්‍රියාවලියට පෙර ඉහත සඳහන් ආයතන වල කසළ අවස්ථා තුනකදී බර කිරීමේ ක්‍රියාවලියට භාජනය කර එම ආයතනයෙන් මසකට ජනනය වන කසළ ප්‍රමාණය ගණනය කර අය කරන බදු ප්‍රමාණය ගරු සභාව මගින් තීරණය කළ යුතුව ඇත.

කසළ බදු අයකිරීමට පෙර කසළවල බර කිරීම සඳහා අවශ්‍ය උපකරණ මිලදී ගැනීමටත් උපකරණ මිලදී ගෙන කසළ බදු අය කිරීමටත් ,එම කාර්ය සඳහා සේවක මහතුන් යොමු කිරීමටත් සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

<u>ගරු මන්ත්‍රී එම්.එම්.තිස්ස ගුණසිංහ මැතිතුමා</u>

දැනට බිබිල ප්‍රාදේශීය සභාව මගින් හෝටල් කිහිපයක සහ ගාමන්ට් කිහිපයකින් ඇතුළට ගොස් කිරා කසළ රැගෙන මුදල් අයකිරීම කරනවා දැයි අසන ලදී. යශෝධරා බාලිකා පාසළ තුළට ගොස් කසළ රැගෙන එන විට දෙමව්පියන්ගෙන් මුදල් අයකර ඇති බවට දෙමව්පියන්ගෙන් චෝදනා තිබෙන බව පැවසීය.

<u>ගරු සභාපති වී.සරත් විදානගම මැතිතුමා</u>

බිබිල ප්‍රදේශයේ හෝටල් හා ගාමන්ට් කිහිපයක ඇතුළට ගොස් කසළ බර කිරා ලබා ගන්නා බවත් ඒවායින් මුදලක් අය කරන බවත් , බාලිකා විද්‍යාලයෙන් මුදල් අයකර නොමැති බවත් පැවසූ අතර මෙම ක්‍රියාවලිය විධිමත් කිරීමට කටයුතු කරන බවත් පැවසීය. කසළ බදු අය කිරීම පිළිබඳව මුදලක් තීරණය කිරීමට වැඩිදුර අධ්‍යනය කර තීරණයක් ගැනීමට ඊළඟ සභාවට කල් තබමු යැයි පැවසීය.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් විවාද අවස්ථාව අවසන් බව මූලාසනය විසින් ගරු සභාවට දැනුම් දෙන ලදී.

**අදාළ යෝජනාව ඉදිරි මහ සභාවට කල් තබන ලදී.**

**<u>(ඉ).01.04. බිබිල සතිපොළ E කඩ කාමර සම්බන්ධවයි.</u>**

**"F ශ්‍රේණියේ කඩ කාමර සඳහා රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව මගින් කීමනි මුදල රුපියල් දස ලක්ෂයක් (1,000,000.00) ලෙසද මාසික කුලිය රු.1700.00ක් ලෙසද තක්සේරු කර ඇත.**

**ඒ අනුව 2025.12.16 දිනැති සභා තීරණ අංක 05.01.15 අනුව E කඩ කාමර සඳහා ද එම ගාස්තුවම අය කිරීමට සභාව තීරණය කර ඇත. තවද පැරණි බදුකරුවන්ට ඉල්ලුම් කරන ලෙසද වසර 10කට බදු දීම සඳහා ආණ්ඩුකාර අනුමැතිය ලබා ගැනීමට ද තීරණය විය.**

**එමෙන්ම E කඩ කාමර සඳහා රජයේ තක්සේරුවක් ලබා ගැනීමට තක්සේරු දෙපාර්තමේන්තුවට යොමු කළයුතු බැවින් තක්සේරු දෙපාර්තමේන්තුවෙන් තක්සේරු ලබා ගැනීමටත්, F කඩ කාමර ගිවිසුම්ද E කඩ කාමර සඳහා අදාල කර ගැනීමටද සුදුසු බව තීරණය කර ඇත.**

ඒ අනුව බිබිල සතිපොළ E කඩ කාමර 13 රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව මගින් පහත පරිදි තක්සේරු කර වාර්තාව එවා ඇත.

| අනු අංකය | කඩ කාමර අංකය | ආපසු නොගෙවන අතරුදවුම් මුදල රු. (එක කඩ කාමරයක් සඳහා) | ආපසු නොගෙවන අත රුදවුමු මුදලට යටත් මාසික කුලිය රු. (එක් කඩ කාමරයක් සඳහා ) |
|---|---|---|---|
| 01 | අංක 01 සිට 11 දක්වා කඩ කාමර (කඩ කාමර 11) | රු.114,000.00 | රු.1200.00 |
| 02 | අංක 12 සිට 13 දක්වා කඩ කාමර (කඩ කාමර 02) | රු. 150,000.00 | රු. 1650.00 |

සම්මත අතුරු ව්‍යවස්ථාවේ ද 41 වගන්තියේ (iii) හි පහත පරිදි සඳහන් වේ.

“පැරණි වෙළඳපොළ ගොඩනැගිල්ලක් ඉවත් කර එම ස්ථානයෙහිම නව වෙළඳසැල ඉදිකර ඇති අවස්ථාවකදි පැරණි වෙළඳසැලෙහි බදුකරුවන් විසින් නව වෙළඳසැලෙහි කඩ කාමර ඉල්ලා සිටින්නේ නම් සභාව විසින් නියම කරන එකවර ගෙවන මුදලක් හා 31 (ii) වගන්තිය යටතේ නියම කළ මාසික බදු කුලිය මෙන් තුන් ගුණයකට සමාන මුදලක් සභාව නියම කරන දිනයකට පෙර සභාවට ගෙවා 32 වගන්තියෙහි සඳහන් ගිවිසුමට එළඹෙන්නේ නම් තරඟකාරි ටෙන්ඩර් කැඳවීමකින් තොරව කඩ කාමර බදු අයිතිය පවරා දිය හැකිය."

එබැවින් E කඩ කාමර බදු ලබාගෙන සිටි පැරණි බදුකරුවන්ගේ නාම ලේඛනය පහතින් ඉදිරිපත් කරන අතර රජයේ තක්සේරුකරු විසින් එවන ලද තක්සේරු වාර්තාව අනුව අදාල කී මනි මුදල ගෙවා කඩ කාමර ලබා ගැනිමට එම අයට හැකියාව ඇති බැවින් ඒ සඳහා ඉදිරිපත් වන ලෙස දන්වා ලිපි යැවීමට කටයුතු කිරිම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.( 2026.05.15 දින මහ සභාවට මෙම යෝජනා ඉදිරිපත් කළ අතර පුළුල්ව සාකච්ඡා කර තීරණය කිරීමට ඉදිරි මහ සභාවට කල් තබා ඇති යෝජනාවකි)

| සතිපොල කඩ කාමර අංකය | බදුකරුගේ නම | ලිපිනය |
|---|---|---|
| E 01 | ඩබ්.ඇම්.ගුණසිරි මයා | කිවුලපිටලන්ද,බිබිල |
| E02 | එම්.බී.නන්දාවති | කිවුලපිටිලන්ද,බිබිල |
| E03 | උපාලි විජේහේවා මයා | මහියංගන පාර,බිබිල |
| E04 | ආර්.ඩබ්.එම්.ස්වර්ණපාල මයා | කිවුලපිටලන්ද,බිබිල |
| E 05 | එස්.ජේ.ඒම්.සුමනාවති මිය | 01 කණුව,මහියංගන පාර,බිබිල |
| E 06 | සුමනා විජේවර්ධන මිය | කිවුලපිටලන්ද,බිබිල |
| E 07 | කේ.කේ.දුමින්ද මයා | මඩකලපුව පාර,බිබිල |
| E 08 | ඒ.ආර්.ගුණරත්න මැණිකේ මිය | බදුල්ලගම්මන,හෙල්ලිවත්ත,බිබිල |
| E 09 | ආර්.එම්.සරත් මයා | වැගම,බිබිල |
| E 10 | ආර්.එම්.පුංචිබණ්ඩා මයා | 02 කණුව,වැගම,බිබිල |
| E 11 | ඊ.එම්.ධර්මසේන මයා | අංක 10,දම්පතිගම,බිබිල |

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ආර්.බී.ප්‍රේමතිලක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

**ගරු සභාපති වී.සරත් විදානගම මැතිතුමා**

බිබිල සතිපොළ E කඩකාමර වල මේ වනවිට ආරක්ෂිත වැටක් හා දොරවල් සකස් කර නැති බවත් එබැවින් බිබිල ප්‍රාදේශීය සභාවේ සභා අරමුදලින් ආරක්ෂිත වැට ඉදි කිරීම හා බදු ලබා ගන්නා බදු කරුවන් විසින් බිබිල ප්‍රාදේශීය සභාවේ කාර්මික නිළධාරීන්ගේ අධීක්ෂණය යටතේ එතුමාගේ උපදෙස් පරිදි දොරවල් සවි කිරීමේ කටයුතු සිදුකළයුතු බව පැවසීය.

**ගරු මන්ත්‍රී එම්.එම්. තිස්ස ගුණසිංහ මැතිතුමා**

බිබිල සතිපොළ E කඩ කාමරවල පැරණි බදුකරුවන් කොතරම් කාලයක් ප්‍රාදේශීය සභාවට බදු ගෙවා තිබේදැයි විමසූ අතර E කඩ කාමරවල සමහර බදුකරුවන් මාස 3ක් හා 4ක් වැනි කෙටි කාලයක් බදුගෙන සිටි බවත් එබැවින් මෙම බදුකරුවන් ප්‍රාදේශීය සභාවේ ලියාපදිංචිව සිටිනවාද කොතරම් කාලයක් බදු ගෙවා තිබේදැයි පිළිබඳ තොරතුරු සොයා බලා කටයුතු කිරීම සුදුසු බව පැවසීය.

අදාළ කරුණ සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට මහ සභාව කාරක සභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී එම්.එම්.තිස්ස ගුණසිංහ මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩබ්.එස්.එම්. වසන්ති ප්‍රියදර්ශනී සමරකෝන් මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

සාකච්ඡාවෙන් අනතුරුව කාරක සභාව නැවත මහ සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු උප සභාපති එච්.එම්. අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා ස්ථිර කරන ලදී.

**ගරු සභාපති වී.සරත් විදානගම මැතිතුමා**

E කඩ කාමරවල පැරණි බදුකරුවන්ගේ නාම ලේඛනයේ සඳහන් බදුකරුවන් තවමත් ජීවත්ව සිටිනවාදැයි පළමුව හඳුනා ගතයුතු බවත්, ජීවත්ව නොසිටින්නේ නම් එම පළමු බදුකරුවන්ගෙන් නීත්‍යානුකූලව පවරා තිබේදැයි හඳුනාගෙන මෙම නාම ලේඛනයේ ජීවතුන් අතර සිටින හා නීත්‍යානුකූලව පවරා ගිවිසුම්ගතවී ඇති බදුකරුවන් වෙත තම තක්සේරුවට අනුව කීමනි මුදල ගෙවා අදාල කඩ කාමරය බදු ගන්නා ලෙසත් කඩ කාමරයේ දොරත් ප්‍රාදේශීය සභාවේ අධීක්ෂණය යටතේ ප්‍රාදේශීය සභාවට දන්වන ආකාරයට තමා විසින් සවි කළ යුතු බවත් දන්වා ලිපි යැවිය යුතු බවත් බිබිල ප්‍රාදේශීය සභාවේ සභා අරමුදලින් ආරක්ෂිත වැට ඉදි කිරීමේ කටයුතු කළයුතු බවත් පැවසීය.

මෙම කාලසීමාව තුළම මූල්‍යමය තත්වය ශක්තිමත් වුවහොත් දෙවන තට්ටුවේ සිට මෙම කඩ කාමර දක්වා පාලමක් සකස් කිරීමට ද කටයුතු කරන බව පැවසීය. කඩ කාමර බදු දීමෙන් පසු පාලමක් ඉදිකළහොත් මෙම කඩ කාමරවල වටිනාකම ඉහළ යන බැවින් වර්ෂ තුනකට පසුව සිදුකරනු ලබන තක්සේරුවේදී මාසික කුලී මුදල වැඩි කර ගැනීමට හැකි වනු ඇතැයි පැවසීය.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් විවාද අවස්ථාව අවසන් බව මූලාසනය විසින් ගරු සභාවට දැනුම් දෙන ලදී.

ගරු මන්ත්‍රී ඩී.එම්.ශ්‍රියාණි මංගලිකා මැතිතුමිය පෙ.ව.11.30 ට සභා ගර්භයට පිවිසෙන ලදී.

**E කඩකාමරවල පැරණි බදුකරුවන්ගේ නාම ලේඛනයේ සඳහන් බදුකරුවන් තවමත් ජීවත්ව සිටින්නේදැයි පළමුව හඳුනාගෙන ජීවත්ව නොසිටින්නේ නම් පළමු බදුකරුගෙන් නීත්‍යානුකූලව පවරා තිබේදැයි හඳුනාගෙන,**

- **එම ජීවතුන් අතර සිටින හා නීත්‍යානුකූලව පවරා ගිවිසුම්ගත වී ඇති බදුකරුවන් වෙත තක්සේරුවට අනුව නව කීමනි මුදල ගෙවා අදාළ කඩකාමර බදු ගන්නා ලෙසද ,**

- **E කඩ කාමරවල දොරන් ප්‍රාදේශීය සභාවේ අධීක්ෂණය යටතේ ප්‍රාදේශීය සභාව දන්වන ආකාරයට තමා විසින් සවිකර ගතයුතු බවත්,**
- **ආරක්ෂිත වැට සභා අරමුදලින් ඉදිකරන බවත් දනවා**

**හඳුනාගත් E කඩ කාමර හිමියන් වෙත ලිපි යැවීමට කටයුතු කිරීමට හා පැරණි බදුකරුවන්ගේ නාම ලේඛනයෙහි කඩ කාමරවලට නීත්‍යානුකූලව අයිතියක් නොමැති කඩ කාමර හා ලිපි යැවීමෙන් පසු බදු නොගන්නා කඩ කාමර නැවත ටෙන්ඩර් කර බදු දීමටත් තීරණය කරන ලදී.**

අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් සභාවේ අසුන්ගෙන සිටි මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවූයෙන් ඒකමතිකව සභා සම්මත විය.

ගරු මන්ත්‍රී ඩබ්.එම්.එම්. අසංක වාසළ මැතිතුමා හා ගරු මන්ත්‍රී එල්.ඒ.බී.චින්තිකා හර්ශනී මැතිතුමිය සභා ගර්භයෙන් පිටව යන ලදි.

**<u>(ඉ).01.05.බිබිල වාණිජ ගොඩනැගිල්ලේ පළමු මහළ ඉදිකිරීම සම්බන්ධවයි.</u>**

පළාත් පාලන ආයතනවල ආදායම් උත්පාදන ව්‍යාපෘති සඳහා කාර්ය සාධනය මත පදනම් වූ ප්‍රාග්ධන ප්‍රදාන ලබාදීම සම්බන්ධයෙන් පළාත් පාලන අමාත්‍යාංශයේ ජ්‍යේෂ්ඨ සහකාර ලේකම්ගේ (පළාත් පාලන) 2026.06.01 දිනැති ලිපිය මගින් මෙම ව්‍යාපෘතිය සඳහා රුපියල් මිලියන 10ක් ලබා දෙන බවත් ඉතිරි මුදල වන රුපියල් මිලියන 18.5 ක මුදල සභා අරමුදලින් දරණ බවට ලිපියකින් දැනුම් දෙන ලෙස දන්වා එවා ඇත. (ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුගත මුදල රුපියල් මිලියන 28.5කි) රුපියල් මිලියන 18.5ක මුදල සභා අරමුදලින් හෝ දේශීය ණය සහ සංවර්ධන අරමුදලින් ණය මුදලක් ලබා ගැනීම තුළින් දරන්නේද යන්න සාකච්ඡා කර තීරණය කරන ලෙස මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ආර්.බී.ප්‍රේමතිලක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

**<u>ගරු සභාපති වී.සරත් විදානගම මැතිතුමා</u>**

බිබිල සභාව සතු සතොස ගොඩනැගිල්ලේ උඩු මහළ ඉදි කිරීමට අපේක්ෂිත කොන්ක්‍රීට් පාදම දිරමින් පවතින බැවින් මෙම ගොඩනැගිල්ල කඩිනමින් ඉදිකළ යුතු බව පැවසූ අතර එම ගොඩනැගිල්ල ඉදිකිරීමට ඇස්තමේන්තුගත මුදල අමාත්‍යාංශයේ ජ්‍යේෂ්ඨ සහකාර ලේකම්ගේ ( පළාත් පාලන) 2026.06.01 දිනැති ලිපිය මගින් මෙම ව්‍යාපෘතිය සඳහා රුපියල් මිලියන 10ක් ලබා දෙන බව දන්වා ඇත. ඒ සඳහා රුපියල් මිලියන 18.5 ක මුදලක් දේශීය ණය සහ සංවර්ධන අරමුදලින් ණය මුදලක් ලබා ගෙන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන බව පැවසීය.

නමුත් 2018 වර්ෂයේ සිට බිබිල ප්‍රාදේශීය සභාවට රුපියල් දෙකෝටි නව ලක්ෂක පමණ මුදලක් පළාත් පාලන ආයතන මගින් මුද්දර බදු ආදායම ලැබීමට තිබෙන බැවින් එම මුදල ලැබුණහොත් එමගින් මෙම ගොඩනැගිල්ල ඉදි කිරීමට යොදා ගතහැකි බව පැවසීය. අවුරුදු 8ක් තිස්සේ බිබිල ප්‍රාදේශීය සභාවට නොලැබුණු එම මුද්දර බදු ආදායම පිළිබඳ පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් විමසූවිට එම මුදල බිබිල ප්‍රාදේශීය සභාවට ගෙවා ඇති බව වාචිකව පැවසුවද බිබිල ප්‍රාදේශීය සභාවට නොගෙවා ඇති බවත්, ගෙවීම් කර තිබේ නම් අදාළ විෂය නිළධාරි මෙන්ම වාර්ෂික අවසන් ගිණුම තුළ ඇතුළත් විය යුතු බව පැවසීය.

මුද්දර බදු මුදල බිබිල ප්‍රාදේශීය සභාවට නොගෙවා ඇති බවට තහවුරු කරගෙන ගරු ආණ්ඩුකාරතුමා දැනුවත් කර වර්ෂ 8ක මුද්දර බදු ආදායම ලබා ගැනීමට කටයුතු කළයුතු බව පැවසීය. මෙම වර්ෂයේ ලැබීමට ඇති උසාවි දඩ මුද්දර ගාස්තු හා ලැබීමට ඇති වරිපනම් ගාස්තුද අයකර ගතහොත් මෙම ඉදිකිරීම සිදු කිරීමට එතරම් අපහසු නොවන බව පැවසීය. සතොස ගොඩනැගිල්ලේ උඩ කොන්ක්‍රීට් එක මේ වනවිට දිරාපත් වීමට ලක්ව ඇති බැවින් දේශීය ණය සහ සංවර්ධන අරමුදලින් ණයක් ලබා ගෙන ඉදිකිරීම් කටයුතු ආරම්භ කරමු යැයි පැවසීය. බිබිල සතිපොළ, සභා ලේකම් නිළ නිවාසය, දොඩම්ගොල්ලේ ගොඩනැගිල්ල ආදී අඩක් නිම කර ඇති මහල් ගොඩනැගිලිවල කොන්ක්‍රීට් පාදම දිරාපත්වීමට ලක්ව ඇති බැවින් ඒවායෙහිද උඩුමහල් ඉක්මණින් ඉදිකළයුතු බව පැවසීය. දේශීය ණය සහ සංවර්ධන අරමුදලින් ණයක් ලබාගතහොත් ප්‍රාදේශීය සභාවට ලැබීමට ආදායමක් තිබෙන බැවින් එම මුදලින් පියවීම් කිරීමට හැකිවන බව පැවසීය. එම උඩු මහලෙහි රෙදිපිළි අලෙවි සැලක් ආරම්භ කිරීමට බලාපොරොත්තු වන බවත් එමගින් ආදායම උත්පාදනය කර ගැනීමට බලාපොරොත්තු වන බවත් තව දුරටත් පැවසීය.

<u>ගරු මන්ත්‍රී එම්.එම්.තිස්ස ගුණසිංහ මැතිතුමා</u>

මේ වනවිට බිබිල ප්‍රාදේශීය සභා අරමුදලින් විශාල මුදලක් නොමැති බැවින් දේශීය ණය සහ සංවර්ධන අරමුදලින් රුපියල් මිලියන 18.5 ක ණය මුදලක් ලබාගෙන සතොස ගොඩනැගිල්ලේ උඩු මහල ඉදිකිරීම සුදුසු බව පැවසීය. දැනට ඉදිකර ඇති ගොඩනැගිල්ලේ ද දේශීය ණය සහ සංවර්ධන අරමුදලින් ණය ලබාගෙන ඉදිකර ඇති බවද පැවසීය.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් විවාද අවස්ථාව අවසන් බව මූලාසනය විසින් ගරු සභාවට දැනුම් දෙන ලදී.

**බිබිල සතොස ගොඩනැගිල්ලේ පළමු මහළ ඉදිකිරීම සඳහා පළාත් පාලන ආයතනවල ආදායම් උත්පාදන ව්‍යාපෘති සඳහා කාර්ය සාධනය මත පදනම් වූ ප්‍රාග්ධන ප්‍රදාන මගින් ලබා දෙන මිලියන 10ට අමතරව අවශ්‍ය වන රුපියල් මිලියන 18.5 ක මුදල දේශීය ණය සහ සංවර්ධන අරමුදලින් ණය මුදලක් ලබාගෙන ඉදිකිරීමට සුදුසු බව තීරණය කරන ලදී.**

අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් සභාවේ අසුන්ගෙන සිටි මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවූයෙන් ඒකමතිකව සභා සම්මත විය.

ගරු මන්ත්‍රී එල්.ඒ.බී.චින්තිකා හර්ශනී මැතිතුමිය පෙ.ව.11.30 ට සභා ගර්භයට පිවිසෙන ලදී.

**<u>(ඉ).01.06. බිබිල ප්‍රාදේශීය ලේකම් සතු බිබිල ලංකා ගාමන්ට් ආයතනයට යාබඳව ඇති ඉඩම් කොටසක් වාණිජ කටයුත්තක් වෙනුවෙන් ලංකා ගාමන්ට් ආයතනයට දීර්ඝකාලීන බදු ලබාදීමට ප්‍රාදේශීය සභාවේ නිර්දේශ ලබාදීම සම්බන්ධවයි.</u>**

බිබිල , 1කණුව, මහියංගන පාර යන ලිපිනයෙහි පිහිටි ලංකා ගාමන්ට් පුද්ගලික සමාගමට යාබද රජය සතු රූඩ් 03 පර්චස් 35.9 ක ඉඩම් කොටසක් වාණිජ කටයුත්තක් වෙනුවෙන් දීර්ඝ කාලීන බදු ලබා දෙන ලෙස ප්‍රාදේශීය ලේකම්ගෙන් එකී සමාගම විසින් ඉල්ලා ඇත. බිබිල ප්‍රාදේශීය ලේකම් විසින් අංක බි/ඉ/10/දීබදු /04 හා 2026.05.19 දිනැති ලිපිය මගින් බිබිල ප්‍රාදේශීය සභාවේ නිර්දේශය ලබා දෙන ලෙස දන්වා ඇති බැවින් සාකච්ඡා කර තීරණයක් ලබා ගන්නා ලෙස මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන  මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට  විවාද අවස්ථාව ලබාදෙන ලදී.

**<u>ගරු සභාපති වී.සරත් විදානගම මැතිතුමා</u>**

බිබිල නගරයේ නාගරික සීමාව තුළ පිහිටා ඇති මෙම ඉඩම වාණිජ වටිනාකමකින් යුක්ත වූවකි. මෙම ඉඩම රජය සතු ඉඩමක් (ප්‍රාදේශීය ලේකම් සතු) බැවින් මෙම ඉඩමට යාබදව බිබිල ලංකා ගාමන්ට් ආයතනය පිහිටා ඇති බැවින් එම ආයතනය සඳහා දීර්ඝකාලීන බදු ලබාදීමට බිබිල ප්‍රාදේශීය සභාවේ එකඟතාවය ඉල්ලා සිටින බව පැවසීය. මෙම ආයතනය බිබිල ප්‍රදේශයේ බොහොමයක් ජනතාවගේ රැකියා අවස්ථා සපුරාලන බැවින් එම ආයතනය දීර්ඝකාලීන බදුදීමට එකඟතාවය ලබාදීමට සුදුසු බව පැවසීය. මෙම ඉඩම ලංකා ගාමන්ට් ආයතනය සඳහා ලබා දෙනවාද එසේත් නැතිනම් ගමේ ප්‍රජාශාලාවක් ඉදිකිරීමට හෝ වසමේ රාජ්‍ය නිළධාරීන් සඳහා කාර්යාල ඉදිකිරීමට කොටසක් වෙන් කරගත යුතුදැයි සාකච්ඡා කරන ලෙස ගරු සභාව වෙත දැන්විය.

**<u>ගරු මන්ත්‍රී පී.කේ.ඩී. රෝහිත පුෂ්ප කුමාර මැතිතුමා</u>**

මෙම ඉඩම් කොටස රජය සතු ඉඩම් කොටසක් වුවද මෙය බදු දීමෙන් බිබිල ප්‍රාදේශීය සභාවට කිසියම් ගෙවීමක් සිදු නොකරන බැවින් ලංකා ගාමන්ට් ආයතනයෙන් බිබිල ප්‍රදේශයේ රැකියා විරහිත තරුණ තරුණියන් රැසකගේ රැකියා අවස්ථා සම්පූර්ණ කළද මෙම ඉදිකිරීම් සඳහා බිබිල ප්‍රාදේශීය සභාවට මුදලක් අයකළයුතු බව පැවසීය.

**<u>ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා</u>**

මෙම ඉඩම අක්කරයකට ආසන්න ඉඩම් කොටසක් බැවින් මෙම ඉඩම ලංකා ගාමන්ට් ආයතනය ප්‍රාදේශීය ලේකම්තුමාට දීර්ඝකාලීන බදු ලබාදීමට එකගතාවය ලබාදීමට පෙර එම ඉඩම පිළිබඳව සොයා බලා තීරණයක් ගැනීමට ඉදිරි මහ සභාවට කල් තැබීම සුදුසු බව පැවසීය.

**<u>ගරු මන්ත්‍රී ඩබ්.එස්.එම්. වසන්තී ප්‍රියදර්ශනී සමරකෝන් මැතිතුමිය.</u>**

අක්කරයකට ආසන්න ප්‍රමාණයක් මෙම ඉඩමෙහි ඇති බැවින් සේවා පියසක් හෝ රජයේ රජයේ නිළධාරීන් සඳහා කාර්යාල ලෙස භාවිතා කිරීමට ගොඩනැගිල්ලක් ඉදිකිරීමට ඉඩමෙන් කොටසක් තබාගෙන කොටසක් පමණක් ලංකා ගාමන්ට් ආයතනයට ලබාදීමට සුදුසු බව පැවසීය.

**<u>ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා</u>**

පෞද්ගලික අංශයේ ආයෝජකයින් බිබිල ප්‍රදේශයේ ආයෝජනයන් කිරීමට අකමැති වුවද දැනට බිබිලෙහි ලංකා ගාමන්ට් ආයතනය ආරම්භ කර තිබීම බිබිලේ ශ්‍රමිකයන්ට හොඳ අවස්ථාවක් බව පැවසූ අතර නව කර්මාන්ත ආරම්භ කිරීමට බලාපොරොත්තු වන මේ සමයෙහි තිබෙන මෙම ගාමන්ට් ෆැක්ටරිය තවත් පුළුල් කර ඉදිකර කර්මාන්ත වැඩිදියුණු කිරීමෙන් බිබිලේ ජනතාවගේ ජීවන තත්වය නගාසිටුවීමට හැකිවන බැවින් හා බිබිලට නව ආයෝජකයින් නොපැමිණෙන  බැවින් බිබිලට සම්පතක් වූ මෙම ලංකා ගාමන්ට් ආයතනයට මෙම ඉඩම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් දිගුකාලීන බදු ලබා දීමට ප්‍රාදේශීය සභාව ලෙස එකඟතාවය ලබාදීම සුදුසු බව පැවසීය.

**ගරු මන්ත්‍රී එම්.එම්. තිස්ස ගුණසිංහ මැතිතුමා**

මෙම ඉඩම බිබිල ප්‍රාදේශීය ලේකම් සතු ඉඩමක් බැවින් ලංකා ගාමන්ට් ආයතනයට දිගුකාලීන බදු දීමට පෙර සේවා පියසක් ආරම්භ කිරීමට මෙම ඉඩමෙන් කොටසක් වෙන් කර ගැනීමට හැකියාවක් ඇති බව පැවසීය. රාජ්‍ය සේවකයින්ගේ සුභ සාධන සංගමයට , විශ්‍රාමිකයින්ගේ සුභසාධන සංගමයට රැස්වීම් ශාලා ඉදි කිරීමට රජය සතු ඉඩම් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ලබාදී ඇති බැවින් ප්‍රාදේශීය ලේකම්තුමාගෙන් මෙම ඉඩමෙන්ද කොටසක් වෙන් කර ගැනීමට ඉල්ලීමක් කළහොත් වෙන්කර ගැනීමට හැකිවනු ඇතැයි පැවසීය.

**ගරු මන්ත්‍රී පී.කේ.ඩී.රෝහිත පුෂ්පකුමාර මැතිතුමා**

මෙම ඉඩම ආගමික කටයුත්තක් සඳහා යොදවා ගැනීමට හැකියාව තිබේදැයි පැවසීය.

**ගරු සභාපති වී.සරත් විදානගම මැතිතුමා**

මෙම ඉඩම සඳහා දැනටමත් වරිපනම් බද්දක් අය කරන අතර මෙම ඉඩමෙහි ඉදිකිරීම් සියල්ලම සඳහා ප්‍රාදේශීය සභාවෙන් අනුමැතිය ලබාගත යුතු බවත් එම ඉදිකිරීම් සඳහා බිබිල ප්‍රාදේශීය සභාවට අයවියයුතු සියළු අයවීම් අයකරන බව පැවසීය. එතුමාගෙන් ඉඩමෙන් කොටසක් රාජ්‍ය නිළධාරීන්ගේ කාර්යාල ස්ථාපිත කිරීමට කොටසක් ඉල්ලුවහොත් ලබාදෙනු ඇතැයි සිතන බවත් මෙම ඉඩමෙහි පරම අයිතිය ප්‍රාදේශීය ලේකම් සතු වන බැවින් මෙම ඉඩම කොතරම් මුදලකට කෙතරම් කාලයකට බදු දෙන්නේ දැයි එතුමන් විසින් තීරණය කරනු ඇතැයිද පවසන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් විවාද අවස්ථාව අවසන් බව මූලාසනය විසින් ගරු සභාවට දැනුම් දෙන ලදී.

**බිබිල ප්‍රාදේශීය ලේකම්තුමා සතු බිබිල ලංකා ගාමන්ට් ආයතනයට යාබදව ඇති ඉඩම් කොටස වාණිජ කටයුත්තක් වෙනුවෙන් ලංකා ගාමන්ට් ආයතනයට දීර්ඝකාලීන බදුදීමට ප්‍රාදේශීය සභාවේ නිර්දේශය ලබාදීමට තීරණය කරන ලදී.**

අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් සභාවේ අසුන්ගෙන සිටි මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවූයෙන් ඒකමතිකව සභා සම්මත විය.

**(ඉ).01.07. බිබිල ප්‍රාදේශීය සභාවට අයත් බිබිල ළමා උයන අසළ ඇති ඉඩම සම්බන්ධවයි.**

බිබිල ප්‍රාදේශීය සභාවට අයත් බිබිල ළමා උයන අසළ ඇති ඉඩමෙහි නාගරික සංවර්ධන අධිකාරි පනතේ වගන්ති උල්ලංඝනය කරමින් අනවසර ඉදිකිරීම් කටයුතු සිදු කරනු ලබන බිබිල, කණුල්වෙල, මඩිප්පලම්මුල්ල පාර දරණ ස්ථානයේ පදිංචි ඩී.එම්.එන් හංසනී ගුණසේකර යන අයට සංවර්ධන කටයුතු නතර කරන මෙන් දැන්වුවද එකී ඉඩම ඔවුන් සතු බැවින් ප්‍රාදේශීය සභාවට විරුද්ධව නීතිමය ක්‍රියාමාර්ග ගන්නා බව නීතිඥයෙකු මාර්ගයෙන් දන්වා එවා ඇත. නමුත් ප්‍රාදේශීය සභාව සතු ලිපි ලේඛන වලින් මෙම ඉඩම සභාව සතු ඉඩමක් බවට තහවුරු වන බැවින් නීතිමය ක්‍රියා මාර්ග ගැනීම සඳහා සභා අනුමැතිය ලබා දීමට සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එම්.ධම්මික බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

අදාළ කරුණ සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට මහ සභාව කාරක සභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු උප සභාපති එච්.එම්. අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

සාකච්ඡාවෙන් අනතුරුව කාරක සභාව නැවත මහ සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩබ්.එස්.එම්.වසන්ති ප්‍රියදර්ශනී සමරකෝන් මැතිතුමිය ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් විවාද අවස්ථාව අවසන් බව මූලාසනය විසින් ගරු සභාවට දැනුම් දෙන ලදී.

**බිබිල ළමා උයන අසළ ඇති ඉඩම බිබිල ප්‍රාදේශීය සභාව සතු ලිපි ලේඛන වලින් සභාව සතු ඉඩමක් බවට තහවුරු වන බැවින් අනවසර ඉදි කිරිමක් ලෙස කඩා ඉවත් කර ළමා උද්‍යාන ඉඩමට එකතු කර ළමා උද්‍යානය පුළුල් කිරීමට තීරණය කරන ලදී.**

අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් සභාවේ අසුන්ගෙන සිටි මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවූයෙන් ඒකමතිකව සභා සම්මත විය.

**(ඉ).01.08. ඉසුරු උයන පානීය ජල යෝජනා ක්‍රමය සඳහා සභා අනුමැතිය ලබා ගැනීම සම්බන්ධවයි.**

ඉසුරු උයන ජල යෝජනා ක්‍රමය සඳහා 2024 වර්ෂයේ ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතිය (LDSP) යටතේ ඒ සඳහා අවශ්‍ය ජල නල උපාංග මිලදී ගෙන ඇතත් , අරමුදල් නොමැති වීම හේතුවෙන් එහි වැඩ කටයුතු මේ දක්වා අවසන් කිරීමට නොහැකි වී ඇත.

2026 විමධ්‍යගත අයවැය සංවර්ධන වැඩ සටහන යටතේ බිබිල ප්‍රාදේශීය ලේකම් වෙත රතුපස්කැටිය (ඉසුරු උයන) පානීය ජල යෝජනා ක්‍රමය සඳහා රුපියල් මිලියන 2ක මුදලක් වෙන් කර ඇත. එම ජල යෝජනා ක්‍රමයට අදාළ තොරතුරු 2026.05.06 දින ප්‍රාදේශීය ලේකම් වෙත ඉදිරි කටයුතු සඳහා ඉදිරිපත් කර ඇත.

නල එලීමේදී අදාළ ඉඩම් සම්බන්ධ ගැටළුවක් මතු වුවහොත් එම ආයතනයට පහසුවෙන් නිරාකරණය කර ගැනීමට හැකියාවක් ඇති බැවින්, බිබිල ප්‍රාදේශීය සභාව මගින් මිලදී ගෙන ඇති ජලනල උපාංග ප්‍රාදේශීය ලේකම් වෙත ලබා දීමටත් ප්‍රාදේශීය ලේකම් වෙත වෙන් කර ඇති ප්‍රතිපාදන යොදවා ඉසුරු උයන පානීය ජල යෝජනා ක්‍රමයේ නල එලීම සිදු කිරීමට සභාවේ එකගතාව ලබා දීම සුදුසු බවත්, අදාළ කාර්ය නිමවා එම ජල යෝජනා ක්‍රමය පවත්වා ගෙන යාමට හා එහි නඩත්තු කටයුතු බිබිල ප්‍රාදේශීය සභාව වෙත භාර ගැනීමටත් සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එම්. ජානක නිමල් බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් විවාදයක් සිදු නොවූ අතර මූලාසනය විසින් විවාද අවස්ථාව අවසන් බව ගරු සභාවට දැනුම් දෙන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අසුන්ගෙන සිටි මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවූයෙන් ඒකමතිකව සභා සම්මත විය.

**(ඉ).01.09.සතිපොළ ගොඩනැගිල්ල ඉදිරිපිට කොන්ක්‍රීට් පොළොව රෙදිපිළි වෙළඳාමට සුදුසු පරිදි සකස් කර ලබා දෙන ලෙස වෙළඳුන් විසින් කර ඇති ඉල්ලීම සම්බන්ධවයි.**

සතිපොළ භූමියෙහි අවුරුදු 20ක පමණ කාලයක් වෙළඳාම් කටයුතු සිදු කරන රෙදිපිළි වෙළඳුන් වූ මෙම පිරිසට ගොඩනැගිල්ල තුළ වෙළඳාම අඩු බැවින් සතිපොළ ගොඩනැගිල්ල ඉදිරිපිට කොන්ක්‍රීට් කොටස අවුරුදු සමයෙහි ලබා දී ඇත. සතිපොළ ගොඩනැගිල්ල නැවත නිසියාකාරව සකස් කරන තෙක් සතිපොළ ගොඩනැගිල්ල ඉදිරිපිට කොන්ක්‍රීට් කොටස රෙදිපිළි වෙළඳාම සිදු කිරීමට සුදුසු ආකාරයෙන් සකස් කර දෙන ලෙස කර ඇති ඉල්ලීම පිළිබඳව සාකච්ඡා කර තීරණයක් ලබා ගන්නා ලෙස මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එම්. රූපසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

**ගරු සභාපති වී.සරත් විදානගම මැතිතුමා**

බිබිල සතිපොළ වෙළඳසැළ ඉදිරිපිට ඇති කොන්ක්‍රීට් කොටස රෙදිපිළි වෙළඳුන් සඳහා ලබාදීමට ගැසට් කර නොමැත. සතිපොළ ඇතුළතින් රෙදිපිළි වෙළඳුන් හට ස්ථාන ලබාදී තිබුණ ද එම ස්ථානවල රෙදිපිළි අලෙවි නොවීම නිසා ඔවුනට ආදායමක් නොලැබෙන බව පවසා බිබිල ප්‍රාදේශීය සභාවට මෙන්ම ගරු ආණ්ඩුකාරතුමාට පළාත් පාලන කොමසාරිස්තුමාට දුක්ගැනිවිලි ඉදිරිපත් කර ඇති බව පැවසීය. සතිපොළ පොළ කාසි එකතු කරන සේවක මහතුන්ද මෙම වෙළඳුන්ට ආදායමක් නොමැති බව තහවුරු කර ඇති බව පැවසූ අතර එබැවින් වෙළඳුන්ට අලුත් අවුරුදු සමයෙහි රෙදිපිළි වෙළඳාමට තාවකාලිව සතිපොළ ඉදිරිපිට කොන්ක්‍රීට් කොටස ලබාදුන් බවත් මේවන තෙක්ම එම වෙළඳුන් තාවකාලිකව ඉදිකරගත් ව්‍යාපාර ස්ථානවල වෙළඳාම් කරන බැවින් ඒ අයට නීත්‍යානුකූලව මෙම ස්ථාන ලබාදීමට හෝ ඉන් ඉවත් කිරීමට සිදුවන බව පැවසීය.

මෙම ස්ථානයෙහි පළතුරු ,රසකැවිලි වර්ග , පාන්, බඩ ඉරිඟු, පැණි කොමඩු , ප්ලාස්ටික් බඩු වෙළඳාම් කිරීමට ගැසට් කර තිබෙන බවත් ගැසට් එකට අනුව කටයුතු කරන්නේ නම් මේ අය මෙම ස්ථානයෙන් ඉවත් කළ යුතු බවත් එවිට ඒ අයට පෙර මෙන්ම ආදායම නොලැබෙනු ඇතැයි පැවසීය. ගරු ආණ්ඩුකාරතුමා විසින්ද මේ රෙදිපිළි අළෙවි කරන්නන් ආදායම් නොලැබීම පිළිබඳව සිදුකරනු ලබන මැසිවිලි සඳහා ප්‍රාදේශීය සභාව ලබාගෙන ඇති ක්‍රියාමාර්ගය පිළිබඳව විමසුවද එයට පිළිතුරක් මේ වන තෙක් යවා නොමැති බවත් පැවසීය. සතිපොළ නිවැරදිව බෙදීම් කර ව්‍යාපාරිකයින්ට බෙදා දෙන තෙක් තාවකාලිකව රෙදිපිළි වෙළඳුන්ට කොන්ක්‍රීට් කොටස ලබා දෙමු යැයි පැවසීය.

මෙම සතිපොළ ගොඩනැගිල්ලේ ප්‍රවිශ්‍යයෙහි ප්‍රශ්නයක් තිබෙන බැවින් නිවැරදි කර ඉදි කිරීමට අවශ්‍ය බවත් සතිපොළ පිටුපස කොටස තහඩු වලින් වහළය සකස් කර ඇති බැවින් එම කොටස අධික ලෙස රත්වන බැවින් එම ස්ථානයේ වෙළඳාම් කිරීමට භාණ්ඩ තබා ගැනීමට ( පළා වර්ග, එළවළු වර්ග) අපහසු බැවින් දර්ශනීය බව පිළිබඳව නොසලකා ගොඩනැගිල්ල ඇතුළතම කුඩාරම් ගසා ගැනීමට අවස්ථාව දීමට සිදුවන බව පැවසීය.

**<u>ගරු මන්ත්‍රී එම්.එම්.තිස්ස ගුණසිංහ මැතිතුමා</u>**

රෙදිපිළි වෙළඳුන් හට මෙම ස්ථානය ලබාදුන් පසු ගැසට් කර දැන් ලබාදී ඇති වෙළඳුන් හටද ගැටලුවක් සිදුවන බවත් භාණ්ඩයක් මිලදී ගැනීමට කෙනෙකු කුමන ස්ථානයක තිබුණද මිලදී ගැනීමට එම ස්ථානයට යන බව පැවසූ අතර රෙදිපිළි වෙළඳුන්ට සතිපොළ ඉදිරිපිට කොන්ක්‍රීට් කොටස ලබාදීම ගැටළුවක් බව පැවසීය.

**<u>පී.කේ.ඩී.රෝහිත පුෂ්ප කුමාර මැතිතුමා</u>**

සතිපොළ ඉදිරිපිට කොන්ක්‍රීට් කොටස රෙදිපිළි වෙළඳුන්ට ලබාදීම සුදුසු බවත් පිවිසුම් මාර්ග ඉදිකිරීමේදී පහත මාලයේ වාහන නැවතුම්පොළේ ඉදිරියෙන් පඩිපෙළක් සකස් කරදීම සුදුසු බවත් පිටුපසට යන මාර්ග සකස් කර එම ඇක්ටඩ් ගොඩනැගිල්ල සතිපොළ පිටුපස තහඩු සහිත වහළය සහිත පෙදෙසේ සිටින වෙළඳුන්ට ලබාදීම සුදුසු බව පැවසීය. රථවාහන නැවතුම්පොළෙහි පිටුපස මේ වන විට ගබඩා සඳහා ලබාදී ඇති පරිදි කඩකාමර සකස් කර ලබාදීම සුදුසු බව පැවසූ අතර මේ වන විට ආයුර්වේදයක් ස්ථාපිත කිරීමටත් කොටසක් වෙන් කර ගැනීමට හැකි වේදැයි පුද්ගලයෙකු තමාගෙන් ඇසූ බවත් පැවසීය. එම ස්ථානය පුද්ගලයින්ට ව්‍යාපාරික ස්ථාන ලබා දීමට සුදුසු ස්ථානයක් බව පැවසීය.

සතිපොළ පහත මාලයේ දැනට ලබාදී ඇත්තේ තාවකාලික කඩ බැවින් ඒවා කඩා ඉවත් කිරීමට කටයුතු කරන බවත් එම ස්ථානය රථවාහන නැවතුම්පොළ සඳහාම ලබාදීමට කටයුතු කරන බවත් ගරු මූලාසනය විසින් සභාවට දන්වා සිටින ලදී.

**<u>ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා</u>**

මෙම සතිපොළ ඉදිරිපිට කොන්ක්‍රීට් කොටස පාන් ලොරි ,පළතුරු ,ප්ලාස්ටික් හා විකුණුම් ප්‍රවර්ධන සඳහා ලබාදී ඇති බැවින් රෙදිපිළි අලෙවිකරුවන්ට ලබාදීම නිසා ගැටලු ඇතිවනු ඇතැයි පැවසීය. මේ අයට මෙම ස්ථාන ලබාදුනහොත් ඉවත් කිරීමේදී ගැටලු ඇතිවන බවත් ලබා දෙන්නේ නම් නිවැරදි දිග, පළල ,උස ලබාදී කිසියම් ප්‍රමිතියකට එම ස්ථානයේ කඩ ඉදිකළයුතු බවත් නැතිනම් සතිපොස ඉදිරිපිට ඇති දර්ශනීය බවට හානියක් සිදුවන බවත් පැවසීය. මේ පිළිබඳ තීරණයක් ගැනීමට ඉදිරි මහ සභාවකට කල්තැබීම සුදුසු බව පැවසීය.

**<u>ගරු මන්ත්‍රී එල්.ඒ.බී.චින්තිකා හර්ශනී මැතිතුමිය.</u>**

රාත්‍රී කාලයේදී සතිපොළ ව්‍යාපාරිකයින්ගේ විකිණීමට ඇති බඩු සුනඛයින් විසින් ආහාරයට ගන්නා බව සතිපොළ ව්‍යාපාරිකයින් විසින් තමන් වෙත දැන්වූ බවත් ඒ සඳහා ක්‍රියාමාර්ගයක් ගතයුතු බව පැවසීය.

**<u>ගරු සභාපති වී.සරත් විදානගම මැතිතුමා</u>**

රදලියද්ද ආදාහනාගාරයේ මුරකරු විසින් රාත්‍රී 10.00ට 11.00ට පමණ සතිපොළින් ව්‍යාපාරිකයින් ඉවත් වනතුරු සිට සුනඛයින් පලවා හැර විදුලි බුබුළු නිවා දමා දොරගුළු වැසීම සිදු කිරීමට කටයුතු කරන බව පැවසීය. තවදුරටත් මෙම ප්‍රශ්නය පවතී නම් සතිපොළට මුරකරුවෙකු යෙදවීමට කටයුතු කරමු යැයි පැවසීය.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් විවාද අවස්ථාව අවසන් බව මූලාසනය විසින් ගරු සභාවට දැනුම් දෙන ලදී.

**අදාළ යෝජනාව ඊළඟ මහ සභාවට කල් තබන ලදී.**

**(ඉ).01.10. බිබිල ප්‍රාදේශීය සභාවේ ඉඩම් හා ගොඩනැගිලි හා යටිතල පහසුකම් ප්‍රත්‍යාගණනය කිරීම සම්බන්ධවයි.**

පළාත් පාලන කොමසාරිස්ගේ අංක 12/02/10/05-01 හා 2026.06.01 දනැති ලිපිය මගින් ඉඩම්, ගොඩනැගිලි හා යටිතල පහසුකම් ප්‍රත්‍යාගණනය කළයුතු බැවින් තක්සේරු කිරීම් කළයුතු බව දන්වා එවා ඇත. එබැවින් බිබිල ප්‍රාදේශීය සභාවේ ඉඩම්, ගොඩනැගිලි හා යටිතල පහසුකම් කඩිනමින් ප්‍රත්‍යාගණනය කළයුතු බැවින්, බිබිල ප්‍රාදේශීය සභාවේ ඉඩම් හා ගොඩනැගිලි තක්සේරු කිරීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව මගින් මුදල් ගෙවා තක්සේරු කරන්නේද එසේත් නැතිනම් ප්‍රාදේශීය සභාව විසින් පත් කර ගනු ලබන කමිටුවකින් තක්සේරු කරන්නේද යන්න සාකච්ඡා කර තීරණය කරන ලෙස මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එම්.ධම්මික බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

ගරු මන්ත්‍රී ඩබ්.එස්.එම්.වසන්ති ප්‍රියදර්ශනී සමරකෝන් මැතිතුමිය ප.ව. 1.05 ට සභා ගර්භයෙන් පිටව යන ලදී.

අදාළ කරුණ සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට මහ සභාව කාරක සභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු ඩබ්.එම්. රූපසේන මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඒ.එම්.ජානක නිමල් බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු මන්ත්‍රී කේ.ජී.උදය සඳරුවන් ජයසිංහ මැතිතුමා ප.ව. 1.15 ට සභා ගර්භයෙන් පිටව යන ලදී.

සාකච්ඡාවෙන් අනතුරුව කාරක සභාව නැවත මහ සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී එල්.ඒ.බී.චින්තිකා හර්ශනී මැතිතුමිය ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් විවාද අවස්ථාව අවසන් බව මූලාසනය විසින් ගරු සභාවට දැනුම් දෙන ලදී.

**බිබිල ප්‍රාදේශීය සභාව සතු වත්කම් රාශියක් තක්සේරු කිරීමට ඇති බැවින් තක්සේරු දෙපාර්තමේන්තුවෙන් තක්සේරුවෙන් තක්සේරු කිරීමට විශාල මුදලක් වැයවන බැවින් හ ප්‍රාදේශීය සභාව මගින් කමිටුවක් පත් කිරීමේදී ඒ සඳහා රජයේ ලියාපදිංචි තක්සේරු කරුවෙකු පත් කිරීමට සිදුවුවහොත් එම නිළධාරියාට ද විශාල මුදලක් ගෙවීමට සිදුවන බැවින් වත්කම් තක්සේරු කිරීම සඳහා වත්කම් තක්සේරු කිරීම පිළිබඳව පළාත් පාලන කොමසාරිස්තුමාගෙන් උපදෙස් ලබා ගැනීමට සුදුසු බව තීරණය කරන ලදී.**

අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් සභාවේ අසුන්ගෙන සිටි මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවූයෙන් ඒකමතිකව සභා සම්මත විය.

**(ඉ).01.11.බිබිල පොදු වෙළඳපොල අංක B 02 කඩ කාමරය බදු ගෙන ඇති කේ.පී.අල්විස් මයා මිය ගොස් ඇති බැවින් එම්.එම්.පී.එස් කුමාරි මියට කඩ කාමරය පවරා දිම සම්බන්ධවයි .**

බිබිල පොදු වෙළඳපොල B 02 කඩ කාමරය කේ.පී.අල්විස් මයා විසින් බදු ලබා ගෙන ඇත. හිඟ මුදල් ගෙවීම සිදු නොකිරිම හේතුවෙන් 2025.04.04 දින සිට එම කඩ කාමරයේ ගිවිසුම අවලංගු කර ඇත.

බදුකරුවන් විසින් ගරු ආණ්ඩුකාරතුමා වෙත ඉදිරිපත් කල අභියාචනය පරිදි ගරු ආණ්ඩුකාරතුමා විසින් ලබා දුන් උපදෙස් වලට අනුව පළාත් පාලන කොමසාරිස්ගේ අංක 12/4/2/5 හා 2026.01.27 දිනැති ලිපිය මගින් කඩ හිමියන්ගෙන් සියළු හිඟ ගාස්තු අය කොට ගෙන සභාව සමඟ එම කඩ හිමියන් එළඹ ඇති ගිවිසුමේ කොන්දේසි,මූලික නීතීන් සහ අනු නීති මඟින් ලබා දී ඇති නෛතික විධිව විධාන උපදෙස් සලකා බලා මෙම කඩ හිමියන් වෙත නැවත ලබා දීම සම්බන්ධව මහ සභාවේ තීරණයක් ගෙන ඉදිරි කටයුතු සිදු කිරිම සුදුසු බව දන්වා ඇත.

ඒ අනුව බිබිල ප්‍රාදේශිය සභාවේ 2026.02.17 දින පවත්වන ලද මාසික සභා රැස්වීමේ අංක (ඉ)01.04 තීරණයට අනුව හිඟ මුදල් ගෙවිම් කරන ලෙස මගේ අංක BPS/03/09/01 හා 2026.03.30 දිනැති ලිපිය මඟින් බදුකරු දැනුවත් කර ඇත.

එසේම B 02 කඩ කාමරයේ බදුකරු වන කේ.පී.අල්විස් මයා 1992 වසරේ මිය ගොස් ඇති බවත් ඥාති සම්බන්ධතාවයක් මත ඔහුගේ නමින් බදු ගෙවන්නා ලෙස එම්.එම්.පී.එස් කුමාරි මිය කඩ කුලී මුදල් ගෙවා ඇති බව ලිඛිතව දන්වා ඇත.

ඒ අනුව ඉහත සඳහන් කර ඇති මගේ අංක BPS/03/09/01 හා 2026.03.30 දිනැති ලිපිය මඟින් B 02 කඩ කාමරයට බදු ගෙවන්නා ලෙස ඉදිරිපත් වී ඇති එම්.එම්.පී.එස් කුමාරි මියට කඩ කාමරය පවරා දිමට හැකිද යන්න සලකා බැලිමට අවශ්‍ය ලිපි ලේඛන ඉදිරිපත් කරන ලෙසද දන්වා ඇත.

ඒ අනුව B 02 කඩ කාමරය පවරා ගැනිම සඳහා එම්.එම්.පී.එස් කුමාරි මිය විසින් පහත සඳහන් ලිපිලේඛන ඉදිරිපත් කර ඇත.

- කේ.පී.අල්විස් මයාගේ මරණ සහතිකය
- එම්.එම්.පී.එස්.කුමාරි මියගේ ඉල්ලීම් ලිපිය
- එම්.එම්.පී.එස්.කුමාරි මියගේ උප්පැන්න සහතිකය පිටපත

නමුත් ඥාතිත්වය තහවුරු කිරිමේ ලිපියක් ලබා දී නැත.

එසේම 2013.06.28 දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයෙහි IV (අ) වැනි කොටස පළාත් සභා පළාත් පාලන නිවේදන සම්මත අතුරු ව්‍යවස්ථාවේ පොදු හෝ පෞද්ගලික වෙළඳපොළවල් සම්බන්ධ අතුරු ව්‍යවස්ථාවේ වගන්ති අංක 40 පහත පරිදි සඳහන්වේ.

“36 වැනි වගන්තියේ සිට 39 වැනි වගන්තිය දක්වා වන අතුරු ව්‍යවස්ථාවල කුමක් සඳහන්ව තිබුණද ප්‍රාදේශීය සභාව සතු කිසියම් කඩ කාමරයක බදුකරුගේ ඉල්ලීමක් මත හෝ බදුකරුවෙකු මියගිය අවස්ථාවක හෝ එකී බදුකරුගේ කාලත්‍රයාට හෝ දරුවෙකුට කඩ කාමරය පවරා දීමට එකී අතුරු ව්‍යවස්ථාවල බාධාවක් නොවිය යුතුය. එසේ දෙන ලද තැනැත්තා සමඟ නව බදු ගිවිසුමකට එළඹිය යුතුයි.”

එසේම බිබිල පොදු වෙළඳපොල B 02 කඩ කාමරය සඳහා බිබිල ප්‍රාදේශිය සභාවේ 2026.02.17 දින පවත්වන ලද මාසික සභා රැස්වීමේ අංක (ඉ)01.04 තීරණයට අනුව ලිපිය සකස් කරන දිනය වන විට

පහත පරිදි ගෙවීම් කර ඇත.(හිඟ මුදල් එක් වාරිකයක් තව දුරටත් ගෙවීම් කිරිමට ඉතිරිව ඇත. රු:13750.00)

| දිනය | ලදුපත් අංකය | ගෙවීම් විස්තරය | මුදල රු: |
|---|---|---|---|
| 2026.04.02 | MIX 3199 | 2025. අප්‍රේල් මස සිට 2026 පෙබරවාරි මස දක්වා ගෙවිය යුතු හිඟ මුදලේ පළමු වාරිකය ගෙවීම | 13750.00 |
| 2026.04.06 | MIX 3280 | මාර්තු මස කඩ කුලිය ගෙවීම | 3750.00 |
| 2026.04.24 | MIX 3670 | අප්‍රේල් මස කඩ කුලිය ගෙවීම | 3750.00 |
| 2026.05.15 | MIX 4347 | මැයි මස කඩ කුලිය ගෙවීම | 3750.00 |
| 2026.05.22 | MIX 4683 | 2025. අප්‍රේල් මස සිට 2026 පෙබරවාරි මස දක්වා ගෙවිය යුතු හිඟ මුදලේ දෙවන වාරිකය ගෙවීම | 13750.00 |
| | | එකතුව | 38750.00 |

ඒ අනුව බිබිල පොදු වෙළඳපොල B 02 කඩ කාමරයේ අයිතිය කේ.පී.අල්විස් මයා නමින් ඇති අතර එම කඩ කාමරය එම්.එම්.පී.එස්.කුමාරි මියට පවරා දීම සම්බන්ධව සාකච්ඡා කර තීරණයක් ගැනිමට මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ඩී.එම්.ශ්‍රියාණි මංගලිකා ජයලත් මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

අදාළ කරුණ සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට මහ සභාව කාරක සභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු ඩබ්.එම්. රූපසේන මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී පී.ජයන්ති මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

සාකච්ඡාවෙන් අනතුරුව කාරක සභාව නැවත මහ සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ආර්.බී.ප්‍රේමතිලක මැතිතුමා ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් විවාද අවස්ථාව අවසන් බව මූලාසනය විසින් ගරු සභාවට දැනුම් දෙන ලදී.

**බිබිල පොදු වෙළඳපල අංක B 02 කඩකාමරය බදුගෙන ඇති කේ.පී. අල්විස් මයා මිය ගොස් ඇති බැවින් එම්.එම්.පී.එස්.කුමාරි මියට කඩ කාමරය පවරාදීම සඳහා කේ.පී. අල්විස් මයා, එම්.එම්.පී.එස්.කුමාරි මියට ඇති ලේ ඥාතිත්වය තහවුරු කිරීම සඳහා ලේඛන ඉදිරිපත් කරන ලෙස සිහි කැඳවීමේ ලිපියක් ඉදිරිපත් කිරීමට තීරණය කරන ලදී.**

අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් සභාවේ අසුන්ගෙන සිටි මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවූයෙන් ඒකමතිකව සහා සම්මත විය.

**<u>(ඉ).01.12. බිබිල නගරයට දෛනිකව පැමිණෙන රථවාහන වලින් හා කුලී රථ වාහන වලින් ගාස්තු අයකිරීම සම්බන්ධවයි.</u>**

බිබිල නගරයට දෛනිකව පැමිණෙන රථවාහන සඳහා ගාස්තු අය කිරීම හා දැනට බිබිල නගරයේ පවතින රථ වාහන සංගම් වලට අයත් රථ වාහන ලියාපදිංචි කිරීමේ ගාස්තු හා සංගම් වලට අයත් පහත රථ වාහන සඳහා මාසික ගාස්තු තීරණය කිරීම සඳහා රථ වාහන වර්ග හා රථගාල් පහත සඳහන් පරිදි මෙම ගරු සභාවට ඉදිරිපත් කරමි.

- වෑන් රථ
- ලොරි රථ
- ත්‍රී රෝද රථ
- මෝටර් බයිසිකල්
- ට්‍රැක්ටර් රථ

**නැවතුම්පොළවල්**

- සතිපොළ ගොඩනැගිල්ලේ බිම් මහල
- පොදු වැඩ ඉංජිනේරු කාර්යාල පාර සියඹලා ගස අසල
- ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ලේ කඩ කාමර ඉදිරිපිට

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ආර්.බී.ප්‍රේමතිලක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

<u>ගරු සභාපති වී.සරත් විදානගම මැතිතුමා</u>

බිබිල නගරයට දෛනිකව පැමිණෙන රථවාහන වලින් අයකරන ගාස්තු පිළිබඳව මෙම අවස්ථාවේදී සාකච්ඡා කළයුතු බව ගරු මූලාසනය විසින් දන්වා සිටින ලදී.

<u>ගරු මන්ත්‍රී පී.කේ.ඩී රෝහිත පුෂ්ප කුමාර මැතිතුමා</u>

බිබිල සතිපොළ ගොඩනැගිල්ලේ බිම් මහළ , පොදු වැඩ ඉංජිනේරු කාර්යාල පාර යන ස්ථාන දෙකෙහි දෛනිකව පැමිණෙන වාහන නතර කිරීමට ඉඩක් තිබුණද ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ලේ කඩ කාමර ඉදිරිපිට මාර්ගයෙහි ඉඩක් නොමැති බැවින් එම ස්ථාන දෙකෙහි වාහන නවතා සම්පූර්ණ වූ පසු නගරයට පැමිණෙන අනෙකුත් වාහන නැවැත්වීමට ස්ථාන නොමැති වීම නිසා මහ ජනතාව තමාගේ වාහනය නැවැත්වීමට ස්ථානයක් නොමැතිව අපහසුතාවයට පත්වන බවත් ඒ අය පොලිස් නිළධාරීන්ගේ නීතියේ රැහැනට හසුවන බවත් පැවසීය.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් විවාද අවස්ථාව අවසන් බව මූලාසනය විසින් ගරු සභාවට දැනුම් දෙන ලදී.

- **2026 පෙබරවාරි 17 දින පැවති (ඉ).01.02. මහ සභා තීරණයට අනුව බිබිල නගරයේ කුලී ත්‍රී රෝද රථ ,වෑන් රථ ,ලොරි රථ වලින් පහත සඳහන් ගාස්තු අයකිරීමට සුදුසු බවත් මෙම ගාස්තු වසර තුනෙන් තුනට සංශෝධනය කිරීමට සුදුසු බවත් තීරණය කර ඇති බැවින් ඒ අනුව අය කිරීමටත්**

- **ඉල්ලුම් පත්‍ර ගාස්තු - රු.1000.00**
- **රථ වාහන ලියාපදිංචි ගාස්තු - රු.5000.00**
  **ලොතරැයි කුට්ටිලියාපදිංචි ගාස්තු - රු. 2000.00**

- ස්ටිකර් ගාස්තු - රු. 200.00
- රථ වාහන ගාල් කිරීම සඳහා අය කිරීමේ ගාස්තු (මාසික)
  පාන් ලොරි - රු. 5000.00
  ලොරි රථ - රු. 3500.00
  වෑන් රථ - රු. 5000.00
  ත්‍රී රෝද රථ - රු. 600.00
  ට්‍රැක්ටර් රථ - රු. 1200.00
  JCB යන්ත්‍ර - රු. 5000.00
- පාරිභෝගික වාහන නවතා තැබීම සඳහා ගාස්තු - මෙම රථ වාහන නැවැත්වීමට විධිමත් ක්‍රමවේදයක් සකස් කිරීමෙන් පසු ගාස්තුවක් තීරණය කිරීම
- බේකරි නිෂ්පාදන රථ ගාස්තු (මාසිකව) - රු.5000.00
- ලොතරැයි කුටි ගාස්තු (මාසිකව) - රු. 200.00

➢ **දෛනික රථවාහන ගාල් කිරීම සඳහා කුලී මුදලක් තීරණය නොකරන ලදී.**

අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් සභාවේ අසුන්ගෙන සිටි මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවූයෙන් ඒකමතිකව සභා සම්මත විය.

**(ඉ).01.13. තාවකාලික පදනම මත දෛනික වැටුප් ලබන සේවකයින් සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට ලියාපදිංචි කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීම**

තාවකාලික හෝ දෛනික වැටුප් ගෙවීමේ පදනමින් බඳවා ගන්නා සෑම පුද්ගලයෙකුම සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට දායක කර ගත යුතු බව විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 7/2015 හා 2015.07.23 මගින් දන්වා ඇති බැවින් මෙම ආයතනයේ සේවයේ නියුතු පහත නම් සඳහන් නවක සේවක මහතා සේවා නියුක්තිනයන්ගේ භාර අරමුදලට දායක කර ගැනීමට අවශ්‍ය අනුමැතිය ලබා දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

| නම | තනතුර | පත්වීම් ලිපිය නිකුත් කළ දිනය |
|---|---|---|
| ආර්.එම්.දුමින්ද පුෂ්පකුමාර මයා | තාවකාලික සෞඛ්‍ය කම්කරු | 2026.04.09 |

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් විවාදයක් සිදු නොවූ අතර මූලාසනය විසින් විවාද අවස්ථාව අවසන් බව ගරු සභාවට දැනුම් දෙන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අසුන්ගෙන සිටි මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවූයෙන් ඒකමතිකව සභා සම්මත විය.

**<u>(ඉ).01.14.බිබිල මහජන පුස්තකාලයට පුස්තකාල කම්කරු සේවක මහතෙකු ලබා ගැනීම සම්බන්ධවයි.</u>**

බිබිල මහජන පුස්තකාලයේ 2017 වර්ෂයේ සිට කම්කරු සේවක මහතෙකු නොමැතිවීම හේතුවෙන් පුස්තකාලයේ සියළුම කටයුතු පුස්තකාල කාර්ය මණ්ඩලය විසින් සිදුකරනු ලබන අතර ,පුස්තකාල සේවාව ව්‍යාප්තවීමත් සමග පුස්තකාලයේ දෛනික පිරිසිදු කිරීමේ කටයුතු හා අනෙකුත් සේවා කටයුතු දැනට සිටින සීමිත කාර්ය මණ්ඩලයට සිදු කිරීම ඉතා අපහසු බැවින් පුස්තකාල කම්කරු සේවක මහතෙකු බඳවා ගැනීම මගින් එම ගැටළුවට විසඳුම් ලබාගත හැකි බව බිබිල මහජන පුස්තකාලයේ පුස්තකාලාධිපතිනිය විසින් දන්වා ඇත. එබැවින් පුස්තකාල කම්කරු තනතුරෙන් නව සේවකයකු බඳවා ගැනීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

<u>ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා</u>

බිබිල ප්‍රාදේශීය සභාව සඳහා අලුතින් සේවක මහතුන් 12 දෙනෙකු බඳවා ගැනීමට මීට පෙර මහ සභාවකදී තීරණය කරන ලදී. එසේ බඳවා ගනු ලබන සේවක මහතුන් අතරින් අයෙකු මහජන පුස්තකාලයට පුස්තකාල කම්කරු සේවක තනතුරට බඳවා ගැනීමට සුදුසු බව පැවසීය.

<u>ගරු සභාපති වී.සරත් විදානගම මැතිතුමා</u>

රදලියද්ද සමුදුන්මැදුර ආදාහනාගාරයේ සේවක මහතුන් තිදෙනෙකු සේවයේ නියුක්ත වන අතර මේ වන ආදාහනාගාරයට පැමිණෙන ආදාහන ප්‍රමාණය අඩු බැවින් එම සේවක මහතුන් තිදෙනා දිනකට පැය දෙක බැගින් සේවා මුර ක්‍රමයට පුස්තකාල සේවයේ යෙදවීමට සුදුසු බවත් ඒ අය සේවා කාලයට අමතරව සේවයේ නියුක්ත වන්නේ නම් ගෙවීම් කිරීමට කටයුතු කරමු යැයි පැවසීය.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් විවාද අවස්ථාව අවසන් බව මූලාසනය විසින් ගරු සභාවට දැනුම් දෙන ලදී.

**බිබිල ප්‍රාදේශීය සභාව සඳහා බඳවා ගැනීමට නියමිත කම්කරු සේවකයින් 12 දෙනාගෙන් එක් අයෙකු බිබිල මහජන පුස්තකාලයේ පුස්තකාල සේවක තනතුරට බඳවා ගැනීමටත් එහෙත් රදලියද්ද ආදාහනාගාරයේ සේවයේ නියුතු කම්කරු මහතුන් තිදෙනා සේවා මුර ක්‍රමයට පුස්තකාලයේ සේවයේ යෙදවීමට කටයුතු කිරීමටත් රාජකාරියට අමතරව සේවයේ නියුක්ත වන්නේ නම් ඒ සඳහා අතිකාල දීමනා ගෙවීමට තීරණය කරන ලදී.**

අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් සභාවේ අසුන්ගෙන සිටි මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවූයෙන් ඒකමතිකව සභා සම්මත විය.

**(ඉ).01.15. බිබිල සතොස සඳහා ගොඩනැගිල්ල බදුදීම සඳහා වූ ගිවිසුම්ගත කාලය වෙනස් කර ගැනීම සම්බන්ධවයි.**

බිබිල ප්‍රාදේශීය සභාව සතු සතොස සඳහා බදු ලබාදී ඇති ගොඩනැගිල්ල දැනට  වසර 2න් 2කට ගිවිසුම් ගතවීම සිදු කරනු ලබයි. අවසන් වරට 2026.01.01 දින සිට 2027.12.31 දින දක්වා ගිවිසුම් ගතව ඇත.

එලෙස වසර 2න් 2කට ගිවිසුම් ගතවීම  ගැටළුකාරී බැවින් 2028.01.01 දින සිට වසර 10ක කාලයකට ගිවිසුම් ගතවිම සඳහා සතොස ආයතනයෙන් විමසා ගරු ආණ්ඩුකාරවර අනුමැතිය ලබා ගෙන ගිවිසුම් ගතවීමට සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන  මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට  විවාද අවස්ථාව ලබාදෙන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් විවාදයක් සිදු නොවූ අතර මූලාසනය විසින් විවාද අවස්ථාව අවසන් බව ගරු සභාවට දැනුම් දෙන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන්  සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ  යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අසුන්ගෙන සිටි මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවූයෙන්  ඒකමතිකව සහා සම්මත විය.

ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන  මැතිතුමා  ප.ව. 2.15 ට සභා ගර්භයෙන් පිටව යන ලදී.

**(ඉ).01.16. බිබිල ප්‍රාදේශීය සභාව සතු ඉඩම් පරීක්ෂාව සඳහා  කමිටුවක් පත්කිරීම සම්බන්ධවයි.**

බිබිල ප්‍රාදේශීය සභාව සතු වත්කම් ලේඛනයෙහි ඉඩම් හා ගොඩනැගිලි භෞතිකව සත්‍ය වශයෙන්ම තිබේද යන්න පරීක්ෂා කළ යුතුව ඇත. එබැවින්  ඒ සඳහා  කමිටුවක් පත් කළ යුතු බැවින්,

- එල්.පී. කැටවත්ත මයා - සංවර්ධන නිළධාරි - සභාපති
- ටී.එච්.එස්.සෝමරත්න මයා - සංවර්ධන නිළධාරි - සාමාජික
- ඩී.එම්.තුෂාර චින්තක මයා - පුස්තකාල සහායක - සාමාජික

යන අයගෙන් සමන්විත කමිටුවක් පත් කිරීමට  සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ආර්.බී.ප්‍රේමතිලක  මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට  විවාද අවස්ථාව ලබාදෙන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් විවාදයක් සිදු නොවූ අතර මූලාසනය විසින් විවාද අවස්ථාව අවසන් බව ගරු සභාවට දැනුම් දෙන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන්  සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ  යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අසුන්ගෙන සිටි මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවූයෙන්  ඒකමතිකව සහා සම්මත විය.

**(ඉ).01.17. Clean Sri Lanka වැඩ සටහන යටතේ සුහුරු (Smart) වැසිකිළි පද්ධතියක් ඉදි කිරීම.**

Clean Sri Lanka වැඩ සටහන යටතේ බිබිල නගරයේ සුහුරු (Smart) වැසිකිළි පද්ධතියක් ඉදි කිරීමට යෝජනා වී ඇත. ඒ අනුව ඉදි කිරීමට සුදුසු ස්ථානයක් ප්‍රාදේශීය සභාව සතුව නොමැති අතර ඒ සඳහා ටෙලිකොම් ආයතනයට යාබද දැවැන්ත බෝ ගස සහ මාර ගස අසළ කොටසේ පර්චස් 40ක පමණ කොටසක් සභාව වෙත පවරා දෙන ලෙසත් ප්‍රාදේශීය ලේකම් වෙත යොමු කිරීමට සුදුසු බවත් මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ආර්.බී.ප්‍රේමතිලක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

<u>ගරු සභාපති වී.සරත් විදානගම මැතිතුමා</u>

ටෙලිකොම් ආයතනයට යාබද දැවැන්ත බෝගස හා මාර ගස අසළ මෙම ඉඩම් කොටස නාගරික සංවර්ධන අධිකාරියේ නාගරික සංවර්ධන සැලැස්මට ඇතුළත් කර නොමැති බැවින් මෙම ස්ථානයේ නවීන සුහුරු වැසිකිළි පද්ධතියක් ඉදි කිරීමට සුදුසු ස්ථානයක් ලෙස නාගරික සැලැස්මට ඇතුළත් කරන ලෙස නාගරික සංවර්ධන අධිකාරිය වෙත දන්වා යැවීමට කටයුතු කරන බව පැවසීය. මේ වනවිට නාගරික සංවර්ධන සැලැස්මෙහි ටෙලිකොම් ආයතනයට අයත් ඉඩමක් ලෙස ඇතුළත්ව ඇති බැවින් මෙම ඉඩම් කොටස සුහුරු වැසිකිළි පද්ධතියක් ඉදිකිරීමට සුදුසු ස්ථානයක් ලෙස සැලැස්මට ඇතුළත් කර ගැනීමට කටයුතු කරන බවත් මෙම ව්‍යාපෘතිය 2027 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට යෝජිත බැවින් මෙම යෝජනාව ඉදිරි මහ සභාවකට කල්තැබිය යුතු බව පැවසීය.

<u>ගරු මන්ත්‍රී පී.කේ.ඩී.රෝහිත පුෂ්ප කුමාර මැතිතුමා</u>

මෙම ස්ථානය ජල පෝෂිත ප්‍රදේශයක් බැවින් වැසිකිළි පද්ධතියක් ඉදිකිරීමට සුදුසු දැයි සොයා බැලිය යුතු බව පැවසීය.

<u>ගරු මන්ත්‍රී එම්.එම්.තිස්ස ගුණසිංහ මැතිතුමා</u>

මීට පෙර සභා වාරයන් වලදී මෙම ඉඩම බිබිල ප්‍රාදේශීය සභාව අයිති ඉඩමක් බව සාකච්ඡා වූ බැවින් මෙම ඉඩම ප්‍රාදේශීය සභාවට අයිති ඉඩමක් දැයි සොයා බැලිය යුතු බව පැවසීය. මේ වනවිට මෙම ඉඩම ටෙලිකොම් ආයතනය විසින් වැට ගසා ඇති බවද පැවසීය.

<u>ගරු සභාපති වී.සරත් විදානගම මැතිතුමා</u>

මෙම ඉඩම් කොටසෙහි පැරණි බස් නැවතුම්පොළ පැවැත්වූ බවත් එබැවින් මෙම ඉඩම් කොටස බිබිල ප්‍රාදේශීය සභාවට අයිති ඉඩමක් බවත් පසුකාලීනව මෙම ඉඩම ටෙලිකොම් ආයතනයට පවරා ඇත්දැයි නොදන්නා බවත් එබැවින් මේ පිළිබඳව කරුණු සොයා බැලියයුතු බවත් පැවසීය.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් විවාද අවස්ථාව අවසන් බව මූලාසනය විසින් ගරු සභාවට දැනුම් දෙන ලදී.

**2027 වර්ෂයේ මෙම සුහුරු (Smart) වැසිකිළි පද්ධතිය ඉදිකිරීමට යෝජිත බැවින් මේ වනවිට නාගරික සංවර්ධන අධිකාරියේ නාගරික සංවර්ධන සැලැස්මෙහි මෙම ඉඩම ටෙලිකොම් ආයතනයට අයත් ඉඩමක් ලෙස දැක්වෙන බැවින් නාගරික සංවර්ධන සැලැස්මට සුහුරු (Smart) වැසිකිළි පද්ධතිය ඉදිකරන ස්ථානයක් ලෙස මෙම ඉඩම නාගරික සංවර්ධන සැලැස්මට ඇතුළත් කරන ලෙස නාගරික සංවර්ධන අධිකාරියට දැනුවත් කළයුතු බව තීරණය කළ අතර අදාළ යෝජනාව ඉදිරි මහ සභාවකට ඉදිරිපත් කිරීමට කල් තබන ලදී.**

අදාළ යෝජනාව කල් තැබීමට හා ලබාගත් තීරණය සම්බන්ධයෙන් සභාවේ එකගතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව කල් තැබීමට හා ලබාගත් තීරණය සම්බන්ධයෙන් සභාවේ අසුන්ගෙන සිටි මන්ත්‍රී මණ්ඩලයේ එකගතාවය හිමිවූයෙන් ඒකමතිකව සභා සම්මත විය.

**<u>(ඉ).01.18. බිබිල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ඉඩම් කොටසක් මොබිටෙල් පුද්ගලික සමාගම සඳහා සම්ප්‍රේෂණ කුළුණක් ඉදිකිරීමට දීර්ඝ කාලීන බදුදීමට බිබිල ප්‍රාදේශය සභාවේ නිර්දේශය ලබාදීම.</u>**

සංඥා දුර්වලතා හා ග්‍රාමීය ජනතාවගේ සන්නිවේදන යටිතල පහසුකම් නිසි ලෙස සම්ප්‍රේෂණය නොවීම යන ගැටළු වලට විසඳුම් ලෙස ගමට සන්නිවේදන ජාතික ව්‍යාපෘතිය යටතේ දුරකතන සම්ප්‍රේෂණ කුළුණක් ඉදිකිරීම සඳහා බිබිල කොට්ඨාශයේ අංක 103 බී - බුළුපිටිය ග්‍රාම නිළධාරි වසමේ බුළුපිටිය ගමේ පිහිටි උඩුමුල්ලවත්ත නැමැති රජය සතු ඉඩමෙන් පර්චස් 20ක් දීර්ඝකාලීන බදු ක්‍රමයට ලබාදීමට බිබිල ප්‍රාදේශීය සභාවේ නිර්දේශය ලබා දෙන ලෙස බිබිල ප්‍රාදේශීය ලේකම්ගේ බි/ඉ/10/දීබදු/27 හා 2026.06.17 දිනැති ලිපිය මගින් ඉල්ලුම් කර ඇත. ඒ සඳහා බිබිල ප්‍රාදේශීය සභාවේ නිර්දේශය ලබා දීමට සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී බී.එම්.වීරසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

<u>ගරු මන්ත්‍රී පී.කේ.ඩී.රෝහිත පුෂ්ප කුමාර මැතිතුමා</u>

නවීන තාක්ෂණයේ දියුණුවීම ඉතා හොඳ වුවද මෙම දුරකතන සම්ප්‍රේෂණ කුළුණ ඉදි කිරීම සම්බන්ධයෙන් මිය ගිය ආදිවාසී නායකතුමන් වනාන්තරයේ සිටින මී මැසි ගහණය වදවන බව පවසා දැඩි ලෙස විරෝධතාවයක් දැක්වූ බව පැවසීය.

<u>ගරු සභාපති වී.සරත් විදානගම මැතිතුමා</u>

අභාවප්‍රාප්ත ආදිවාසී නායකතුමන් මීමැසි ගහණය වඳ වන බව පවසමින් මෙම දුරකතන සම්ප්‍රේෂණ කුළුණ ඉදිකිරීමට විරෝදතාවය දැක්වුවද නවීන තාකෂණය භාවිතා කරමින් අධ්‍යාපනය හදාරනු ලබන පාසල් දරුවන්ට මෙම සන්නිවේදන දුර්වලතාවය නිසා මහත් අපහසුතාවයට පත්ව ඇති බැවින් මෙම කුලුණු ඉදිකිරීමට උඩුමුල්ලවත්ත නැමැති රජය සතු ඉඩමෙහි පර්චස් 20ක් දීර්ඝකාලීන බදු පදනමට ලබාදීම සුදුසු බව පැවසීය.

<u>ගරු මන්ත්‍රී ආර්.බී. අත්තනායක මැතිතුමා</u>

මෙම දුරකතන සම්ප්‍රේෂණ කුලුණ බුළුපිටිය වසමෙහි ඉදිකිරීමට මහත් වෙහෙසක් දැරූ බවක් පැවසූ අතර මෙම කුලුණ ලබාදීම පිළිබඳව තමා දැඩි ලෙස සතුටු වන බව පැවසීය. අභාවප්‍රාප්ත රතුගල ආදිවාසී

නායකතුමන් නිල්ගල දුරකතන සමප්‍රේෂණ කුලුණ ඉදි කරන විට මීමැසි ගහණය වඳවීමේ තර්ජනයට ලක්වන බව පවසමින් එතුමා මුල්ලේගම ප්‍රදේශයේ දුරකතන සම්ප්‍රේෂණ කුලුණක් ඉදිකර ගත බව පැවසීය. එතුමන් නිතර දුරකතන භාවිතා කරමින් සන්නිවේදන පහසුකම් ලබාගත් බවත් පැවසූ අතර මෙම යෝජනාවට තමා එකඟතාවය ප්‍රකාශ කරන බවත් මෙම යෝජනාව ඉදිරිපත් කිරීම පිළිබඳ ස්තූතිය ප්‍රකාශ කරන ලදී.

<u>ගරු මන්ත්‍රී බී.එම්.වීරසේකර මැතිතුමා</u>

නවීන තාක්ෂණ ලෝකයේ පමණක් නොව ලංකාව පුරාම ව්‍යාප්තව පවතින සමයක (Deta Signal) නොමැති සන්නිවේදන පහසුකම් නොමැතිව මෙම ප්‍රදේශයේ ජනතාව අපහසුතාවයට පත්ව සිටී. බුළුපිටිය, කරාඩුගල, සේරව, ඌරවුල, මල්දම්අඹේ ගන ගම් වලින් සමන්විත නිල්ගල කොටසට අයත් ජනතාවගේ ඉල්ලීම මත ගරු අමාත්‍ය ජයවර්ධන මැතිතුමාට ඉදිරිපත් කළ බවත් ගරු සභාපතිතුමා, ගරු උප සභාපතිතුමා හා ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී සරත් කුමාර මැතිතුමාගේ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේදී මෙම දුරකතන සම්ප්‍රේෂණ කුලුණ ඉදිකිරීම පිළිබඳව යෝජනා ඉදිරිපත් කළ බවත් ඒවායේ ප්‍රතිඵලයක් ලෙස ගමට සන්නිවේදනය ජාතික ව්‍යාපෘතිය යටතේ දුරකතන සමප්‍රේෂණ කුලුණ ඉදිකිරීමේ ව්‍යාපෘතිය නිල්ගල ප්‍රදේශයට ලැබුණු බව පැවසීය.

අභාවප්‍රාප්ත ආදිවාසී නායකතුමන් එතුමාගේ ප්‍රදේශයට දුරකතන සම්ප්‍රේෂණ කුලුණක් ඉදි කරගෙන ඔවුන්ගේ සන්නිවේදන අවශ්‍යතාවය මෙන්ම නවීන තාක්ෂණය භාවිතා කිරීම සිදු කරනු ලැබුවද බුළුපිටිය හා නිල්ගල ප්‍රදේශවාසීන්ට එම අවස්ථාව නොලැබී ගොස් ඇත. මෙම සන්නිවේදන යටිතල පහසුකම් සංවර්ධනය නොවීම නිසා මෙම ප්‍රදේශයේ දූ දරුවන්ගේ අධ්‍යාපනය මෙන්ම ජනතාවගේ කාලය, ශ්‍රමය, ධනය විශාල ලෙස වැයවීම සිදුවන බව පැවසූ අතර මෙම කුලුණ ඉදිකිරීමට අවස්ථාව ලැබීම ලද ජයග්‍රහණයක් බව පැවසීය.

මොබිටෙල් ආයතනය මගින් ස්ථාන කිහිපයක් පිළිබඳව පරීක්ෂා කර මෙම කුළුණ ඉදි කිරීමට සුදුසුම ස්ථානය ලෙස උඩුමුල්ල නැමැති රජය සතු ඉඩම සුදුසු බව හඳුනාගෙන ඇති බැවින් එම ඉඩමෙන් කොටසක් මොබිටෙල් ආයතනයට දුරකතන සම්ප්‍රේෂණ කුලුණ ඉදි කිරීමට දීර්ඝ කාලීන බදු ලබාදීමට සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයේ සියළු දෙනාම එක්ව එකඟතාවය ලබා දෙමු යැයි පැවසීය.

<u>ගරු මන්ත්‍රී එම්.එම්. තිස්ස ගුණසිංහ මැතිතුමා</u>

බුළුපිටිය ප්‍රදේශයේ දුරකතන සමප්‍රේෂණ කුලුණ ඉදි කිරීම පිළිබඳව විරෝධතාවයක් නොමැති බවත් අභාවප්‍රාප්ත ආදිවාසී නායකතුමන් පැවසූ අන්දමට සතුන්ට වාසය කිරීමට අවස්ථාවක් නොලැබී යනවා සේම කරාඩුගල සිට මල්දම්අඹේ දක්වා දුරකතන පණිවුඩ හුවමාරු කර ගැනීමට නොහැකි වනවා පමණක් නොව පෙර පාසලේ සිට උසස් අධ්‍යාපනය දක්වා Online අධ්‍යාපනය ලබන සමයක මෙම ප්‍රදේශයේ දරුවන්ට පමණක් සිග්නල් නොමැතිවීම හේතුවෙන් Online අධ්‍යාපනය ලබා ගැනීමට නොහැකි වන බව පැවසීය. එසේම නීතිවිරෝදී ජාවාරම් සිදුවන අවස්ථාවල ඒවා පිළිබඳව නීතිය ක්‍රියාත්මක කරන ආයතන දැනුවත් කිරීමටද නොහැකිව ඇති බවද තවදුරටත් පැවසීය. මෙම යෝජනාවට තම පක්ෂයේ නියෝජනය කරන මන්ත්‍රී මණ්ඩලයේ විරෝධතාවයක් නොමැති බව පැවසීය.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අසුන්ගෙන සිටි මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවූයෙන් ඒකමතිකව සභා සම්මත විය.

## (ඊ). කාරක සභා වල වාර්තා ඉදිරිපත් කිරිම.

- 2026.05.15 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසීම පිළිබඳ කාරක සභාවේ වාර්තාව
- 2026.06.04 දින පැවති කාර්මික සේවා පිළිබඳ කාරක සභාවේ වාර්තාව
- 2026.06.12 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසීම පිළිබඳ කාරක සභාවේ වාර්තාව

ගරු මන්ත්‍රී මණ්ඩලයේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරන ලදි.

## (උ).ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ එකතු කළ ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා සහ ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කිරීමට නියමිත වෙනත් ලේඛන ඉදිරිපත් කිරිම හා සලකා බැලීම.

2026 මැයි මාසයට අදාල ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ (ප්‍රා.ස. 16 හා ප්‍රා.ස. 14) සහ හිඟ ආදායම් පිළිබඳ විස්තර (ප්‍රා.ස. 07) ගරු සභාවේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරන ලදි.

**ආදායම්**

| | |
|---|---|
| පුනරාවර්තන ආදායම් | - රු. 9,193,308.04 |
| මූලධන ලැබීම් | - රු. - |
| ප්‍රාග්ධන ලැබීම් | - රු. 270,000.00 |
| වෙනත් ලැබීම් | - රු. 868,507.84 |
| මුළු ලැබීම් | - රු 10,331,815.88 |

**වියදම්**

| | |
|---|---|
| පුනරාවර්තන වියදම් | - රු. 9,187,855.94 |
| ප්‍රාග්ධන වියදම් | - රු. 219,674.36 |
| ණය ආපසු ගෙවීම් | - රු. 144,825.54 |
| වෙනත් වියදම් | - රු. 9,552,355.84 |
| ආයෝජන | - රු. 1,025,045.74 |
| මුළු වියදම් | - රු.10,577,401.58 |

**2026.05.31 දිනට තවදුරටත් හිඟ ආදායම් විස්තරය**

| | |
|---|---|
| වරිපනම් බදු | - රු. 23,133,213.89 |
| අක්කර බදු | - රු. 11,840.58 |
| ජල ගාස්තු නායකඳුර ජල යෝජනා ක්‍රමය | - රු. 2,124,749.00 |
| ජල ගාස්තු රතුපස්කැටිය ජල යෝජනා ක්‍රමය | - රු. 881,038.00 |
| කුලී මුදල් | - රු. 1,738,848.34 |
| ටෙන්ඩර් මඟින් කුලියට දීම් | - රු. 3,476,536.74 |
| එකතුව | - රු. 31,366,226.55 |

## (ඌ).වෙනත් කරුණු

## ගරු මන්ත්‍රී ඒ.එම්.ධම්මික බණ්ඩාර මැතිතුමා

බිබිල ප්‍රාදේශීය සභාව සතුව පවතින ශ්‍රී ලංකා ජාතික කොඩිය , පළාත් කොඩිය, වෙල්ලස්සේ කොඩිය පරණ වී ඇති බැවින් අලුතින් කොඩි තුනක් මිලදී ගැනීමට කටයුතු කරන ලෙස ඉල්ලීමක් කළ අතර බිබිල තානායමම අසළ බුබුල පිහිටි ඉඩම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් මිලියන 5 ව්‍යාපෘතිය මගින් සංවර්ධනය කරනවා දැයි මූලාසනයෙන් අසන ලදී.

මේ වනවිට ස්වභාවික අලංකරණය නගා සිටුවීමේ අරමුණින් එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන බව ගරු මූලාසනය විසින් සභාවට දන්වා සිටින ලදී.

## ගරු මන්ත්‍රී ජේ.ඒ.ජී.විජේන්ද්‍රනාත් වර්ණකුලසූරිය මැතිතුමා

බිබිල බස් නැවතම්පොළ පිහිටා ඇති ජල පිල්ටරය සක්‍රීය තත්වයේ පවතිනවා දැයි ගරු මූලාසනය විසින් විමසන ලදී. ගරු මූලාසනය විසින් එය අක්‍රීය තත්වයේ පවතින බව පැවසීය. බීම සඳහා හා අනෙකුත් කටයුතු සඳහා ජලය ලබා ගැනීමට කරාම දෙකක් තිබෙන බවත් පිල්ටර් කර බීමට ජලය ලබා දෙන ප්‍රධාන ජල සැපයුමට සම්බන්ධ කර ඇති බව ජනතාව තමා හට පැවසූ බවත් එසේ සිදුකර තිබේ නම් එය ජාතික අපරාධයක් බව පැවසීය. නගරයට පැමිණෙන මගී ජනතාව , පාසල් සිසුන් මෙම ජල කරාමය මගින් බීමට ජලය ලබා ගන්නා බැවින් මෙය සභාව මගින් සිදුකර ඇති ලොකු අත්වැරැද්දක් බවත් තමාට මේ බව ජනතාව පැවසූ පසු මෙම ජල කරාමය විවෘත කර බැලූ විට මෙම බීමට ජලය ලබා දෙන කරාමය සම්බන්ධ කර ඇතතේ පිරිපහදු නොකළ ජල සැපයුමට බව හඳුනා ගත් බවත් එබැවින් කඩිනමින් මෙය නිවැරදි කිරීමට කටයුතු කරන ලෙස ගරු මූලාසනයෙන් ඉල්ලා සිටි අතර තමන් වගකීම් ඉටු කිරීමට බැඳී සිටින මන්ත්‍රීවරයෙකු ලෙස කණගාටුව ප්‍රකාශ කරන බවද පැවසීය.

## ගරු මන්ත්‍රී ඒ.ඩී. නිශාන්ත අමරතුංග මැතිතුමා

මෙම සභාව තුළ මීට පෙරද සිදුකළ ඉල්ලීමක් බවත් මන්ත්‍රී මණ්ඩලය සඳහා හිමිවිය යුතු සාමදාන විනිශ්චයකාර පදවිය මේ වන විට ලබාදීමට අවශ්‍ය කටයුතු සිදුකර නැති බැවින් එමමන්ත්‍රී මණ්ඩලයට ලබාදීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටි අතර තමා විසින් ලබාදුන් යෝජනා කිසිවක් මේ වන තෙක් ක්‍රියාත්මක කර නොමැති බවත් සභාව මගින් සම්මත කර ගත් අනෙකුත් යෝජනාද කිසිවක් ක්‍රියාත්මක වී නොමැති බවත් පැවසූ අතර වෙනස් කිරීමට යෝජනා කළ ලොරි රථ වාහන මධ්‍යස්ථාන, සතිපොළ , පාන් ලොරි ස්ථානගත කිරීම් ආදියෙහි ස්ථාන වෙනස් කළද මේ වන තෙක් ඒවා පෙර තිබූ තත්වයෙන්ම පවත්වාගෙන යන බැවින් මේ පිළිබඳව සභාව මගින් තීරණය කර ගෙන සිටියා නම් හොඳ යැයි පැවසීය.

පාරවල් මෝටර් ග්‍රේඩර් කිරීම හැර කිසිම ව්‍යාපෘතියක් සභාව මගින් ආරම්භ කර නොමැති බවත් පෙර රජයේ ආරම්භ කළ ද සෑම ව්‍යාපෘති ආරම්භ කර නොමැති බව පැවසූ අතර මෙම සභාව මගින් ආරම්භ කළ ව්‍යාපෘතිවල ප්‍රගතිය මාසිකව සභාවට ඉදිරිපත් කරන ලෙසද පැවසීය.

## ගරු මන්ත්‍රී එල් .ඒ.බී.චින්තිකා හර්ශනී මැතිතුමිය

බිබිල සතිපොළ විකිණීමට ඇති භාණ්ඩ සුනඛයින් මෙන්ම මිනිසුන්ද සොරා ගැනීමක් සිදුවන බැවින් වෙළඳුන් විසින් CCTV කැමරා පද්ධතියක් සවි කිරීමට ඉලලුම් කරන බැවින් එය කඩිනමින් සවිකිරීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටින ලදී.

## ගරු මන්ත්‍රී පී.කේ.ඩී. රෝහිත පුෂ්ප කුමාර මැතිතුමා

බිබිල ධර්මප්‍රදීප ප්‍රාථමික විද්‍යාලය ඉතා කුඩා ඉඩ ප්‍රමාණයක පවත්වා ගෙන යන බැවින් බිබිල කොටගම සමූපකාරයට අයත් ඉඩමක් වූ ස්ටයිලෝ ව්‍යාපාරය ඉදිරිපිට පිහිටි ඉඩමෙහි ප්‍රාථමික පාසලක් ඉදි කිරීමට යෝජිතව තිබූ අතර එම ඉඩම එකල්හි සමූපකාර දෙපාර්තමේන්තුවේ හිටපු සභාපති හා ඔහුගේ අනුගාමිකයින් එම යෝජනාවට විරුද්ධව ඉඩම ලබා දීමට අකමැත්ත ප්‍රකාශ කර ඇති බව පැවසීය.

කුමන රජයකින් ආරම්භ කළද බිබිල යශෝධරා බාලිකා පාසල දැනට බිබිලට ජයග්‍රහණ ලබා දෙමින් මොණරාගල දිස්ත්‍රික්කයට ම තිබෙන ප්‍රකට මෙන්ම බැබළෙන එකම බාලිකා පාසල බවට පත්ව ඇති බවයි.

දැනට පවත්නා රජයම පාලනය කරන බිබිල ප්‍රාදේශීය සභාව මගින් ද්විභාෂා ප්‍රාථමික පාසලක් වෙල්ලස්සේ ආරම්භ කිරීමට බිබිල ප්‍රාදේශීය සභාව මැදිහත්ව යොජනා ඉදිරිපත් කරමු යැයි පැවසීය.

<u>ගරු මන්ත්‍රී එම්.එම්. තිස්ස ගුණසිංහ මැතිතුමා</u>

එවකට බිබිල ප්‍රාදේශීය සභාව නියෝජනය කළ ගරු සභාපති හා මන්ත්‍රී මණ්ඩලය බිබිලෙහි ප්‍රාථමික පාසල ආරම්භ කිරීමට කටයුතු කළ බවත් සමූපකාර දෙපාර්තමේන්තුව විසින් මෙම භූමිය පාසලක් ඉදි කිරීමට අධ්‍යාපන දෙපාර්තමේන්තුවට ලබා දීමට අකමැති වූ බව පැවසීය.

ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා ප.ව.2.20ට සභා ගර්භයෙන් පිටව යන ලදී.

<u>ගරු සභාපති වී.සරත් විදානගම මැතිතුමා</u>

ගරු මන්ත්‍රී ගාමිණී විජේන්ද්‍රනාත් මැතිතුමා පෙන්වා දුන් ජල පිල්ටරය පිළිබඳ ගැටලුව පිළිබඳව කතා කිරීමේදී මෙම ජල පිරිපහදුව කාර්මික නිළධාරි මහතා මැදිහත් වී ගලවා බැලූ විට එහි පිල්ටරය අබලන්ව ඇති බැවින් ඒවා මිලදී ගැනීමට බිබිල ප්‍රදේශයේ නොමැති බැවින් එම කොටස් පිටින් ගෙන්වා ගැනීමට කටයුතු කරන බවත් එතෙක් නායකඳුර පොදු පිරිපහදුව මගින් පිල්ටර් වී පැමිණෙන ජලය ,ජල අවශ්‍යතාවය සපුරාලීමට ප්‍රධාන ජල සැපයුමට මෙම ජල කරාම සම්බන්ධ කළ බවත් පැවසීය. හැකි ඉක්මණින් බිබිල බස්නැවතුම්පොළ පිල්ටරය අලුත්වැඩියා කිරීම සිදු කිරීමට කටයුතු කරන බව පැවසීය.

ගරු මන්ත්‍රී ඒ.ඩී.නිශාන්ත අමරතුංග මැතිතුමා විසින් සාමදාන විනිශ්වයකාර තනතුරේ දිවුරුම්දීමට මේ වනවිට ලිඛිතව කිසිදු දැනුම් දීමක් නොමැති බැවින් ආසන්න ප්‍රාදේශීය සභාවල මන්ත්‍රී මණ්ඩලය සඳහා සාමදාන විනිශ්වයකාර ධූරයේ දිවුරුම් දුන් ආකාරය , නීතිමය පසුබිම පිළිබඳ අවබෝධයක් ලබා ගෙන කටයුතු කරමු යැයි පැවසීය.

ගරු මන්ත්‍රී චින්තිකා හර්ශනී මැතිතුමිය දැක්වූ ගැටලුව නිරාකරණය කිරීමට මේ වන විට බිබිල ප්‍රාදේශීය සභාව විශාල මෙහෙයක් දරණ බවත් මෙහි ව්‍යාපාරිකයින්ද සතිපොළෙහි ආරක්ෂිත දොර අගුළු දැමූ පසුද ව්‍යාපාරිකයින්ද නැවත සතිපොළට ඇතුලුවීම සිදුකරන බවත් එබැවින් ආරක්ෂාව පිළිබඳව ප්‍රශ්නයක් පවතින බවත් එබැවින් සතිපොළ CCTVකැමරා පද්ධතියක් සවි කිරීමට හෝ ස්ථිර මුරකරුවෙකු යෙදවීමට කටයුතු කිරීම කළයුතු බව පැවසීය.

ගරු මන්ත්‍රී රෝහිත පුෂ්ප කුමාර මැතිතුමා දැක්වූ යෝජනාව ඉතා හොඳ යෝජනාවක් බවත් එවකට ප්‍රාදේශීය සභාව ද සමූපකාර දෙපාර්තමේන්තුවේ සභාපතිවරයාද එකළ ආණ්ඩුව නියෝජනය කළද මෙම ඉඩම පාසලක් ඉදි කිරීමට යොදා ගැනීමට නොහැකි වූ බව පැවසීය. එසේම වර්තමානයේදී එකම ආණ්ඩුවකට සමූපකාර දෙපාර්තමේන්තුවේ හා පළාත් පාලන ආයතනය පවතින බවත් මේ වන විට මෙම ඉඩම සම්බන්ධයෙන් පවතින නඩුව ඉල්ලා අස් කර ගෙන ඇති බැවින් පූර්ණ බලතල ප්‍රාදේශීය

සභාවට පවතින බවත් නමුත් මේ සා විශාල වාණිජ වටිනාකමකින් යුත් ඉඩමක් ප්‍රාථමික විද්‍යාලයක් ඉදිකිරීමට යොදවනවාද ? සමූපකාර දෙපාර්තමේන්තුව හරහාම වාණිජ වටිනාකමකින් යුක්ත සංවර්ධන ක්‍රියාදාමයකට යොදවනවාද? යන්න සාකච්ඡා වෙමින් පවත්නා බව පැවසීය.

මේ වනවිට ප්‍රාථමික පාසලක් ඉදිකිරීමට සම්බන්ධව සාකච්ඡා වෙමින් පවතින බවත් මේ සඳහා සුදුසු ඉඩමක් එනම් නගරයේ ම නොව නගරයට කිලෝමීටරයක් පමණ ඇතින් ඉඩමක් සොයමින් හඳුනා ගනිමින් පවතින බවත් ( ප්‍රාදේශීය ලේකම්තුමා සතු ඉඩමක් , ඌණ උපයෝගීතා සහිත ඉඩම්) පැවසීය. මේ වනවිට වෙන්කර තිබූ මුදල් නැවත වෙනත් අංශයන් සඳහා යොදවාගෙන ඇති බැවින් නැවත මුදල් වෙන් කර ගැනීමක් සිදු කළයුතු බවත් අධ්‍යාපන ඇමති රටේ අග්‍රාමාත්‍යතුමිය බැවින් ඒ සඳහා මුදල් වෙන් කර ගැනීමට හැකි බවත් පැවසීය. මේ සඳහා දිස්ත්‍රික්කයේ පාර්ලිමේන්තු මන්ත්‍රී මණ්ඩලය , ප්‍රාදේශීය සභාව , ගරු ආණ්ඩුකාරතුමා මේ සඳහා විරෝධතාවයක් නොදක්වන බැවින් හැකි ඉක්මණින් ප්‍රතිපාදන වෙන් කරගෙන පළලක් ඉදිකිරීමට හැකි වනු ඇතැයි පැවසීය.

ගරු මූලාසනය විසින් 2026 ජුනි මස මහ සභාව සඳහා සහභාගි වූ සියළු දෙනා හට ස්තූතිය ප්‍රකාශ කරමින්ර ජරට වෙළඳසැළේ අධිපතිතුමන් විසින් බිබිල මහජන පුස්තකාලයට පොත් පරිත්‍යාග කිරීම සිදුවන බැවින් සභාව අවසාන වූ පසු මන්ත්‍රී තුමන්ලා තුමියන්ලා සහභාගි වන ලෙස දන්වා සිටි අතර පොසොන් උත්සවය සඳහා සහභාගි වී ආගමික කටයුතු වල නියුක්ත වන ලෙසත් 2026 ජුනි 30 වන දින සභා ලේකම් තුමියගේ මූලිකත්වයෙන් බිබිල ප්‍රාදේශීය සභාවේ කාර්ය මණ්ඩලය විසින් පවත්වනු ලබන සව් දන්සල පෙ.ව. 11.00 ආරම්භ වන බැවින් ඒ සඳහා සියළු දෙනා සහභාගි වන ලෙස ආරාධනා කරමින් 2026 ජුලි මසට අදාළ මහ සභා රැස්වීම සියළු දෙනාගේ එකඟතාවය මත ජුලි 21 දින පෙ.ව. 9.30 ට සභා රැස්වීම් ශාලාවේදී රැස්වන බව දැනුම් දීමෙන් අනතුරුව ජුනි මස මාසික මහ සභාවේ කටයුතු අවසන් කරන ලදී.

වී.සරත් විදානගම,
සභාපති,
බිබිල ප්‍රාදේශීය සභාව.

**පිටපත් -**

01. පළාත් පාලන කොමසාරිස්, බදුල්ල. - කා.දැ.ගැ.පි.
02. පළාත් පාලන සහකාර කොමසාරිස්, මොණරාගල. - කා.දැ.ගැ.පි.
03.විගණන අධිකාරි - කා.දැ.ගැ.පි.